# 2014 කාර්ය සාධන වාර්තාව
# செயலாற்றல் அறிக்கை
# PERFORMANCE REPORT



පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

உள்ளூராட்சி மற்றும் மாகாண சபைகள் அமைச்சு

MINISTRY OF LOCAL GOVERNMENT & PROVINCIAL COUNCILS

# කාර්ය සාධන වාර්තාව
# 2014

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

# පටුන


| | |
|---|---|
| 01. අමාත්‍යාංශයේ දැක්ම | 7 |
| 02. අමාත්‍යාංශයේ මෙහෙවර | 7 |
| 03. අමාත්‍යාංශයේ අරමුණු | 8 |
| 04. අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර | 9-10 |
| 05. පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර | 11 |
| 06. පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල | 12-15 |
| 07. අමාත්‍යාංශයේ මූලික කාර්යභාරය | 16-17 |
| 08. පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුළ මෙම වර්ෂයේ දී සිදු කරන ලද විශේෂ කාර්යයන් | 18 |
| 09. කාර්ය සාධනය - 2014 | 19-40 |
| 10. ප්‍රධාන පළාත් පාලන සහ පළාත් සභා සංවර්ධන ව්‍යාපෘති | 41-43 |
| 11. ව්‍යාපෘති මාලාව | 44-57 |
| 12. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) | 58-61 |
| 13. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) | 62-66 |

# පෙරවදන

දිවයින තුල සමතුලිත හා තිරසාර සංවර්ධනයක් ඉලක්ක කර ගනිමින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූලික අරමුණයි. එකී අරමුණ සාක්ෂාත් කරලීම සඳහා 2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් රාශියක් මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලදී. යන්ත්‍රෝපකරණ ලබා දෙමින් පළාත් පාලන ආයතන වල යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු කරන ලද අතර, ඒ ඒ පළාත් වල දිළිඳු කම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එසේම අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ වල සංවර්ධන කාර්යන් සඳහා මූල්‍ය සහය ලබාදීමට කටයුතු කරන ලද අතර පළාත් පාලන ආයතන වල පොදු මහජන සේවා සැපයීම කාර්යක්ෂම කිරීම සඳහා ජංගම කුටි සපයන ලදී. ප්‍රාදේශීය සභා වල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහය ලබා දෙමින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. තවද පළාත් පාලන ආයතන වෙත ලීටර් 3600 ක ධාරිතාවයකින් යුත් සුදු යකඩ ජල බවුසර් ලබාදීමට කටයුතු කරන ලදී.

2014 වර්ෂයේදී දිවයිනේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන 13ක් තෝරාගෙන විධිමත් පරිදි මහජන සේවා සැපයීමට හැකිවන අයුරින් එම ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම් උපකරණ ලබාදීම සහ වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මි. 27.15ක් ආයෝජනය කර ඇත.

කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාදාමය තුල කැපී පෙනෙන අංගයක් බවට පත්වී ඇත. හක්මන, දෙහිඕවිට, පල්ලෙපොල, පඩුවස්නුවර, බෙලිඅත්ත, හොරණ හා අක්කරෙයිපත්තු යන නගර සංවර්ධන ව්‍යාපෘති 2014 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. මෙමගින් ප්‍රාදේශිය සභා ගොඩනැගිලි, නගර ශාලා, වෙළඳ සංකීර්ණ මහජන පුස්තකාල, මහජන වැසිකිළි පද්ධති, ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි, කාණු පද්ධති, ආදාහනාගාර, ප්‍රවේශ මාර්ග හා රථ ගාල් ආදී ඉදිකිරීම් හා නවීකරණය කිරීම් සිදු කර ඇත.

ප්‍රමාණවත් ආදායම් මාර්ග නොමැතිවීම නිසා ප්‍රජා යටිතල පහසුකම් දියුණුවී නොමැති ප්‍රාදේශීය සභා 264ක් සඳහා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මූල්‍ය සහය ලබාදී ඇත. මෙම මුදල් ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා යොදවා ඇත.

පළාත් පාලන ආයතන විසින් සපයනු ලබන සේවාවල ඵලදායීතාව ඉහල නැංවීමේ අරමුණින් 2014 වර්ෂයේදීත් පළාත් පාලන සතිය තුල විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කළ අතර පළාත් පාලන කළමනාකරණ තරඟය පවත්වා ජයග්‍රාහී පළාත් පාලන ආයතනවලට සම්මාන ප්‍රදානය කරන ලදී.

"සැමට වඩාත් සුවදායී පරිසරයක්" යන දැක්මෙන් යුක්තව පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන එම ආයතනවල අවශ්‍යතාව අනුව සකස් කරන ලද ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය හා අනෙකුත් පහසුකම් සම්පාදනය කර දෙන ලදී.

ලෝක බැංකු, ආසියානු සංවර්ධන බැංකු හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ ණය ආධාර මත ක්‍රියාත්මක පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, පුර නැගුම ව්‍යාපෘතිය, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය, ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ආදී විදේශාධාර ව්‍යාපෘති රාශියක් 2014 වර්ෂයේදී දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි මෙම අමාත්‍යාංශය මගින් සම්බන්ධීකරණය කොට සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

ඉහතින් දැක්වූ සංවර්ධන කාර්යන්ට අමතරව 2014 වර්ෂයේදී උප ජාතික පාලනයට අදාල නෛතික ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය සහය ලබා දීමද මෙම අමාත්‍යාංශය මගින් සිදුකරන ලදී. ඒ යටතේ සංවර්ධන ක්‍රියාදාමයට බාධාවන්ව දැනට පවත්නා නීති, ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා ආදී නෛතික ප්‍රදානයන් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කර වැඩි දියුණු කිරීම සඳහා ජාතික මට්ටමින් ලබා දිය හැකි සහය හා පහසුකම් සැලසීමට මෙම අමාත්‍යාංශය ප්‍රමුඛත්වයේලා ක්‍රියා කර ඇත.

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය කළමනාකරණ, උපදේශන, පර්යේෂණ හා පුහුණුකිරීම් මගින් පළාත් පාලන හා පළාත් සභා ආයතනයන්හි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ හා තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම උදෙසා පුහුණු වැඩමුළු, සම්මන්ත්‍රණ හා ප්‍රායෝගික සැසි 2014 වර්ෂයේදීද ක්‍රියාත්මක කරන ලදී.

නාගරික, අර්ධ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වන ජනතාව වෙත පළාත් පාලන ආයතන වලින් හා පළාත් සභා වලින් සැපයෙන සේවාවන් වඩා කාර්යක්ෂම හා ඵලදායී කිරීමේ අරමුණින් 2014 වර්ෂයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ඉහත සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

# 01

## අමාත්‍යාංශයේ දැක්ම

බලය බෙදාහැරීම, විමධ්‍යගතකරණය සහ සහභාගීත්ව පාලන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමෙහි ලා කටයුතු කරන ප්‍රමුඛ හා ප්‍රශස්ථ ආයතනය බවට පත් වීම.

# 02

## අමාත්‍යාංශයේ මෙහෙවර

ජනතා අභිලාශයන් සඵල කරවන අන්දමේ කාර්යක්ෂම හා ඵලදායී පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමයක් තහවුරු කිරීම සහ විමධ්‍යගත පාලන ව්‍යුහය සවිමත් කිරීමත් දිරිගැන්වීමත් මගින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර මානව සංවර්ධනයක් උදාකර ගැනීම සඳහා පහසුකම් සම්පාදනය.

# 03 අමාත්‍යාංශයේ අරමුණු

- මධ්‍යම රජය සහ පළාත් සභා අතර සම්බන්ධීකරණය
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය
- ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට සහාය වීම
- මූල්‍ය, තාක්ෂණික හා නෛතික සහාය ලබාදීම සහ ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම
- අන්තර්ජාතික සබඳතා පවත්වාගෙන යාම සහ විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පළාත් පාලන මැතිවරණ පිළිබඳව ජාතික මට්ටමේ වගකීම
- ඵලදායී විමධ්‍යගත පාලනයක් නියාමනය කිරීම
- භෞතික, ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වර්ධනයට  සහාය වීම

# 04 අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර

## 01. පළාත් පාලනයට අදාළ ජාතික නීති වර්තමානයට ගැළපෙන අයුරින් සකස් කිරීම

*ක්‍රියාකාරකම්:-*

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත සම්මත කිරීම.
- මහනගර සභා ආඥා පනත සංශෝධනය කිරීම.
- නගර සභා ආඥා පනත සංශෝධනය කිරීම.
- ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම.

*මේ යටතේ*

- පළාත් පාලන පරිපාලනය, පිරිස් පාලනය, ආදායම් උත්පාදනයට අදාළ නීති යාවත්කාලීන කිරීම.
- මහජන සෞඛ්‍යයට හා පරිසරයට අදාළ නීති යාවත්කාලීන කිරීම.
- කාලීන අවශ්‍යතාවය පරිදි භෞතික සැලසුම් හා සංවර්ධනයට අදාළ නව නීති සකස් කිරීම.
- පොදු උපයෝගිතා සේවා පිළිබඳ නීති සකස් කිරීම සිදු කෙරෙනු ඇත.

## 02. පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රශස්ත පාලනයක් සඳහා අවශ්‍ය සහය ලබා දීම

*ක්‍රියාකාරකම්:-*

- දැනුවත් කිරීම හා පුහුණු කිරීම (පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මෙහෙයවීම මත දේශපාලන නායකයින් සහ නිළධාරීන් පුහුණු කිරීම)
- කාර්යය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම
- නීති කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව ප්‍රවර්ධනය
- පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම
- පළාත් පාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම

## 03. පළාත් පාලන ආයතනවල සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

*ක්‍රියාකාරකම්:-*

- ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
- පරිගණක ආශ්‍රිත සේවා සැපයීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- මළාපවාහන පද්ධති කළමනාකරණය
- පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, වාහන අවශ්‍යතා සපුරා ගැනීමට සහායවීම
- අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල මහජන සේවා පහසුකම් ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම
  - යටිතල පහසුකම් සංවර්ධනය
  - නඩත්තු කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කිරීම

## 04. පළාත් සභා සඳහා සහාය සේවා සම්පාදනය කිරීම

*ක්‍රියාකාරකම්:-*

- පළාත් සභාවලට අවශ්‍ය පුනරාවර්ථන වියදම් නිදහස් කිරීම
- පළාත් සභාවල වියදම් විමංසනය කිරීම

## 05. සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම

*ක්‍රියාකාරකම්:-*

- ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා දේශීය හා විදේශ ආයෝජන යෙදවීමට කටයුතු කිරීම
- ප්‍රාදේශීය මාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ අනෙකුත් පොදු පහසුකම් නංවාලීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම
- කුඩා හා මධ්‍ය පරිමාණ නගර මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම
- ප්‍රාදේශීය ආර්ථික කේන්ද්‍රස්ථාන දියුණු කිරීම
- දේශිය ණය සහ සංවර්ධන අරමුදල මඟින් පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නංවාලීම

# 05 පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර

- ගම්මානවල ජන සනත්වය පදනම් කරගෙන සුදුසු ප්‍රදේශවල ග්‍රාමීය ජලසම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය කේන්ද්‍රස්ථාන හඳුනා ගැනීම සඳහා නව මාවත් ගොඩනැගීම.
- පුළුල් කලයුතු මාර්ග හඳුනා ගැනීම සහ වැඩි දියුණු කිරීම.
- මාර්ග නඩත්තු කිරීමේ කළමනාකරණ පද්ධතියක් යොදා ගැනීම.
- අත්‍යවශ්‍ය මංසන්ධි හඳුනාගෙන රථවාහන කළමනාකරණ ක්‍රම සහ පදික පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කෙරෙනු ඇත.
- ත්‍රී රෝද රථ ගාල් සැපයීම.
- නගර සභා හා මහ නගර සභාවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සහ ජල සම්පාදනය.
- පොදු ස්ථාන හා සේවාවන් වෙත පහසු ප්‍රවේශය සඳහා පහසුකම් වැඩිකිරීම හා නියාමය කිරීම.
- විනෝද උද්‍යාන හා ඇවිදීමේ පථයන් පිහිටුවීම.
- පළාත් සභාවල සහ ප්‍රාදේශීය සභාවල කාන්තා නියෝජනය ඉහළ නැංවීම.

# 06 පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල

**පළාත් පාලන හා පළාත් සභා ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලතාව දැක්වීම වඩාත් පහසුකරලීම සඳහා අමාත්‍යාංශයේ විවිධ අංශ හා ආයතන.**


- පළාත් පාලන සහ පළාත් සභා ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
- පළාත් පාලන සහ පළාත් සභා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
- අමාත්‍යාංශ ලේකම් කාර්යාලය
- පාලන අංශය
- මුදල් අංශය
- පළාත් පාලන අංශය
    - පළාත් පාලන ප්‍රතිසංස්කරණ ඒකකය
    - පළාත් පාලන පැමිණිලි හා තොරතුරු ඒකකය
- පළාත් සභා අංශය
- සංවර්ධන හා සැලසුම් අංශය
    - අඩු ආදායම්ලාභි පළාත් පාලන ආයතන නගා සිටුවීමේ ඒකකය
    - මෙහෙයුම් ඒකකය
    - කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන ඒකකය
    - විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය
    - දැයට කිරුළ සංවර්ධන ඒකකය
    - මාධ්‍ය ඒකකය
    - තොරතුරු තාක්ෂණ ඒකකය
- නීති අංශය
- ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
    - ඩෙංගු මර්ධන ඒකකය

- වියදම් විමංසන අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල


පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ ජාතික පුහුණු ආයතනය වන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එසේම දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කළමනාකරණ කටයුතු ද මෙම අමාත්‍යාංශය මඟින් කටු කරන සුවිශේෂී කාර්යයකි.

## පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා යටතේ ඇති විවිධ අංශ


01. පාලන හා මුදල් අංශය




02. සංවර්ධන හා සැළසුම් අංශය



03. ප්‍රතිපත්ති හා විමංසන අංශය




04. අභ්‍යන්තර විගණන අංශය



# 07 අමාත්‍යාංශයේ මූලික කාර්යභාරය

රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය, පළාත් පාලන හා පළාත් සභා ආයතන තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීම, විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය.

## 01. ප්‍රධාන පළාත් සභා ක්‍රියාකාරකම්

- පළාත් සභා 9 සහ පළාත් පාලන ආයතන 335 වෙත සහාය සේවා සම්පාදනය.
- පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආධාර ව්‍යාපෘති සඳහා විධායක ආයතනය වශයෙන් කටයුතු කිරීම.
- දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට මඟ පෙන්වීම හා සහාය ලබාදීම.
- ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය තුළින් පළාත් පාලන ආයතනවලට අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම.
- පළාත් සභාවලට ප්‍රතිපාදන නිදහස් කිරීම හා වියදම් විමංසනය.
- විදේශ ණය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
- නැගෙනහිර හා උතුරු පළාත්වල පාලන කටයුතු ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

## 02. ප්‍රධාන පළාත් පාලන ක්‍රියාකාරකම්

- යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය කිරීමට හා යහපාලනය ප්‍රවර්ධනය කිරීමට පළාත් පාලන ආයතනවලට සහාය දැක්වීම.
- පසුගාමී පළාත් පාලන ආයතනවලට විශේෂ සංවර්ධන සහායන් ලබාදීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල විධිමත්ව හා ශක්තිමත්ව කිරීමට සහාය දැක්වීම.
- පළාත් පාලන ව්‍යවස්ථා සංශෝධනය කිරීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.

- ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරිම, ආපදා කළමනාකරණය සඳහා පෙර සූදානම සහ ආයතනික හැකියා ප්‍රවර්ධනය.
- කසළ කළමනාකරණය , මලාපවාහන පද්ධතිය නවීකරණය.
- යන්ත්‍ර සූත්‍ර , ගලිබවුසර්, ජල බවුසර් සහ ඩබල් කැබ්රථ ලබාදීම වැනි පහසුකම් සැලසීම.

# 08 පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුල මෙම වර්ෂයේ දී සිදු කරන ලද විශේෂ කාර්යයන්

**මෙම අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ ප්‍රමුඛතාවය දෙමින් සිදු කරන ලද විශේෂ කාර්යයන්:**

01. යන්ත්‍රෝපකරණ ලබා දෙමින් යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීම සඳහා කටයුතු කිරීම.

02. අයවැය යෝජනා අනුව ඒ ඒ පළාත් වල දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

03. අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන බලප්‍රදේශ වල සංවර්ධන කාර්යයන් සඳහා මූල්‍ය සහාය ලබාදීම.

04. පළාත් පාලන ආයතන වල පොදු මහජන සේවා සැපයීම කාර්යක්ෂම කිරීම සඳහා ජංගම කුටි ලබාදීම.

05. ප්‍රාදේශීය සභාවල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දෙමින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

06. ලීටර් 3600 ක ධාරිතාවයකින් යුත් සුදු යකඩ ජල බවුසර් ලබාදීම.

07. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධයෙන් විදේශ ආධාර ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කිරීම.

# 09 කාර්යසාධනය - 2014

## 9.1 පළාත් පාලන අංශය

### 9.1.1 අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නඟා සිටුවීමේ වැඩසටහන

මෙම වර්ෂයේදී පළාත් 07 කට අයත් අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන 13ක් තෝරාගෙන විධිමත් පරිදි මහජන සේවා සැලසීමට හැකිවන අයුරින්, එම පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ඉදි කිරීම්, උපකරණ ලබා දීම සහ වෙනත් යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 27.25 ක් වෙන්කර තිබූ අතර, 2014.12.31 දිනට රු.මිලියන 27.15 ක් වැය කරමින් පහත සඳහන් පරිදි අදාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.


| අනු අංකය | ව්‍යාපෘතිය | පළාත් පාලන ආයතන | යෙදවූ මුදල (රු.මි.) |
|---|---|---|---|
| 01 | ගොඩනැගිලි ඉදි කිරීම හා වැඩිදියුණු කිරීම | හික්කඩුව නගර සභාව<br>බලන්ගොඩ න.ස. ජෛලානි ජාතික පාසල<br>පොල්පිතිගම ප්‍රා.ස<br>පොතුවිල් ප්‍රා.ස<br>ගඟවටකෝරලේ ප්‍රා.ස<br>හොරොව්පතාන ප්‍රා.ස<br>ඇල්ල ප්‍රා.ස | 23.40 |
| 02 | කාර්යාල උපකරණ හා ලීබඩු මිලදී ගැනීම | කන්දෙකැටිය ප්‍රා.ස<br>රඹෑව ප්‍රා.ස<br>වීරකැටිය ප්‍රා.ස | 2.00 |
| 03 | පුස්තකාල පොත් සහ මාර්ග කොන්ක්‍රීට් කිරීම හා සනීපාරක්ෂක කටයුතු සඳහා | මාවතගම ප්‍රා.ස<br>අලව්ව ප්‍රා.ස<br>ඌව පළාත | 1.75 |
| **යෙදවූ මුදල** | | | **27.15** |
| **මූල්‍ය ප්‍රගතිය** | | | **99.6%** |
| **භෞතික ප්‍රගතිය** | | | **100%** |

**ඉහත** 9.1.1. හි සඳහන් පරිදි පසුගාමී පළාත් පාලන ආයතන නඟා සිටුවීමේ වැඩසටහන යටතේ එම පසුගාමී පළාත් පාලන ආයතන සඳහා යෙදවූ මුදල් බෙදී ගොස් ඇති ආකාරය පහත වගු අංක 01 න් හා ප්‍රස්ථාර අංක 01න් පෙන්නුම් කෙරේ.

පසුගාමී පළාත් පාලන ආයතන සඳහා යෙදවූ මුදල් බෙදී ගොස් ඇති ආකාරය

| | පළාත | යෙදවූ මුදල (රු.) |
|---|---|---|
| 01 | දකුණ | 3,704,143.00 |
| 02 | වයඹ | 3,320,974.00 |
| 03 | සබරගමුව | 1,231,069.00 |
| 04 | ඌව | 2,973,257.00 |
| 05 | උතුරුමැද | 3,315,120.00 |
| 06 | මධ්‍යම | 7,000,000.00 |
| 07 | නැගෙනහිර | 5,606,183.00 |
| | **එකතුව** | **27,150,746.00** |

වගු අංක 01




ප්‍රස්ථාර අංක 01

### 9.1.2 පළාත් පාලන ආයතන සතු වාහන අලුත්වැඩියා කිරීම

වඩාත් ඵලදායී මහජන සේවාවන් කාර්යක්ෂමව සැපයීම අරමුණුකොට ගෙන පළාත් පාලන ආයතන 16ක් සඳහා අබලන් තත්වයේ පවතින වාහන අලුත්වැඩියාව සඳහා 2014 වසර තුලදී කටයුතු කර ඇත. මේ සඳහා වෙන් කල මුදල රුපියල් මිලියන 22.75ක් වන අතර, වියදම් කල මුදල රුපියල් මිලියන 19.03කි.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | යෙදවූ මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | රාජාංගනය ප්‍රාදේශීය සභාව | 0.24 |
| 02 | කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව | 1.28 |
| 03 | නිකවැරටිය ප්‍රාදේශීය සභාව | 1.40 |
| 04 | අලව්ව ප්‍රාදේශීය සභාව | 1.49 |
| 05 | ගල්ගමුව ප්‍රාදේශීය සභාව | 1.50 |
| 06 | නාරම්මල ප්‍රාදේශීය සභාව | 1.36 |
| 07 | කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව | 0.94 |
| 08 | පුත්තලම ප්‍රාදේශීය සභාව | 1.40 |
| 09 | අකුරණ ප්‍රාදේශීය සභාව | 1.50 |
| 10 | ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | 1.08 |
| 11 | උඩ පළාත ප්‍රාදේශීය සභාව | 0.84 |
| 12 | පාතදුම්බර ප්‍රාදේශීය සභාව | 1.48 |
| 13 | පූජාපිටිය ප්‍රාදේශීය සභාව | 1.03 |
| 14 | හම්බන්තොට මහනගර සභාව | 0.91 |
| 15 | බද්දේගම ප්‍රාදේශීය සභාව | 1.08 |
| 16 | ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | 1.50 |
| **යෙදවූ මුළු මුදල** | | **19.03** |
| **මූල්‍ය ප්‍රගතිය** | | **83.65%** |
| **භෞතික ප්‍රගතිය** | | **100%** |

### 9.1.3 පළාත් පාලන සතිය

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය තුළ එම ආයතන විසින් ඉටු කරනු ලබන මහජන උපයෝගීතා සේවා ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීමත්, මානව හා භෞතික සම්පත් උපයෝගී කරගැනීම තුළින් මහජනතාව වෙත උපරිම කාර්යක්ෂමතාවයකින් සේවා සැපයීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමත්, පළාත් පාලන ආයතන පිළිබඳව හා මහජන සේවාවන් පිළිබඳව ජනතාව අතර යහපත් ආකල්පයක් සහ මනා  සම්බන්ධතාවයන් ගොඩනැගීම අරමුණ කරගෙන පළාත් පාලන සතිය තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වේ. මෙම වර්ෂයේද අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් පළාත් අනුව තෝරාගත් පළාත් පාලන ආයතන වල පළාත් පාලන සතිය තුළ ක්‍රියාවට නංවන ලද වැඩසටහන් නිරීක්ෂණයට ලක් කරන ලදී.

| ශුද්ධ ප්‍රතිපාදනය | වැයකළ මුදල | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| රු. මිලියන 5 | රු. මිලියන 4.6 | 100 |

### 9.1.4 පළාත් පාලන කළමනාකරණ තරඟය සහ ස්වර්ණ පුරවර සම්මාන උළෙල පැවැත්වීම

මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පළාත් පාලන ආයතනයන්හි යහපාලනය හා කළමනාකරණ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස ජාතික මට්ටමෙන් පළාත් පාලන කළමනාකරණ තරඟය පවත්වා එම ජයග්‍රාහී ආයතන වලට ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීම සඳහා ස්වර්ණ පුරවර සම්මාන උළෙල අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2014 ඔක්තෝබර් මස 21 දින බත්තරමුල්ලේ පිහිටි  වෝටර්ස් එජ් හිදී පවත්වන ලදී.

| ශුද්ධ ප්‍රතිපාදනය | වැයකළ මුදල | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| රු. මිලියන 11.8 | රු. මිලියන 11.8 | 100 |



2014 ඔක්තෝබර් මස 21 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්
බත්තරමුල්ල වෝටර්ස් එජ් හීදී පවත්වන ලද ස්වර්ණ පුරවර සම්මාන උළෙලේදී ජයග්‍රහණය කරන ලද
පළාත් පාලන ආයතන වෙත තිළිණ ප්‍රදානය කිරීම

### 9.1.5 පොදු රාජ්‍ය මණ්ඩල පළාත් පාලන සම්මේලනය පැවැත්වීම

පොදු රාජ්‍ය මණ්ඩලයේ ආසියාතික පළාත් පාලන සමුළුව 2014 සැප්තැම්බර් මස 29 වන දින ගරු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ගලධාරි හෝටලයේදී පවත්වන ලදී.

මෙම සමුළුව සඳහා මාලදිවයින, පාකිස්ථානය, බංගලාදේශය, ඉන්දියාව, මලයාසියාව යන රටවල රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් සහ පොදු රාජ්‍ය මණ්ඩලයේ පළාත් පාලන සමුළු නියෝජිතයන් සහභාගි විය. මෙහි සම්බන්ධීකරණ කටයුතු මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදී.

## 9.2 පළාත් සභා අංශය

පළාත් සභාවල ක්‍රියාකාරීත්වයට පහසුකම් සැළසීම, පළාත් සභාව සහ මධ්‍යම රජය අතර සම්බන්ධීකරණය හා මානව සම්පත් සංවර්ධනය යනාදී කටයුතු මෙම අංශය මගින් මූලික වශයෙන් ඉටු කරනු ලබන අතර, මෙම අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් හා එහි ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

2014.12.31 දිනට මෙම අංශයේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

| අනු අංකය | කාර්යයන් | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් මෙම අමාත්‍යාංශය වෙත එවනු ලබන සේවා ව්‍යවස්ථා පළාත් රාජ්‍ය සේවයට ගැලපෙන අයුරින් සකස් කිරීම | තනතුරු වර්ග 6ක් සඳහා ජාතික ජාතික වැටුප් කොමිසන් සභාව නිර්දේශ කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය ඉදිරි කටයුතු කිරීම සඳහා ප්‍රධාන ලේකම්වරු වෙත යැවීමට කටයුතු කර ඇත. |
| 02 | ඉඩම් අත්පත් කර ගැනීමට අදාල පළාත් සභාවන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් පරීක්ෂා කර ඉඩම් අමාත්‍යාංශයට යොමු කිරීම, අත්පත් කර ගැනීම පිළිබඳ විරෝධතා පරීක්ෂා කිරීමට අදාල පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීම හා අත්පත් කර ගැනීමට (38 අතුරු විධාන යටතේ) ඊට අදාළ නිර්දේශ සමඟ ඉඩම් අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාට දන්වා යැවීම. | මෙම වර්ෂයේ ඉල්ලීම් 24ක් ලැබී ඇති අතර ඉන් 14ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇත. අඩුපාඩු සහිත ඉල්ලීම් 10ක් පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත යවා ඇත. |
| 03 | රාජ්‍ය හා බාහිර ආයතන වලින් සහ පුද්ගලයන්ගෙන් ලැබෙන පෙත්සම් අදාල ආයතන වෙත යොමු කිරීම සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව විසින් යොමු කරන ලද පෙත්සම් වලට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. | පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාවෙන් මෙම අමාත්‍යාංශයට යොමු කල පෙත්සම් 12ක් අදාල බලධාරීන්ට යොමු කර නිර්දේශය ලබාගෙන පිලිතුරු පාර්ලිමේන්තුවට යැවීම, පෙත්සම් 21 ක් සඳහා ගොනු පරීක්ෂා කර මහජන පෙත්සම් කාරක සභාවට නිරිදේශ ඉදිරිපත් කිරීම, |

| | | |
|---|---|---|
| | | විවිධ ආයතන හා පුද්ගලයන්ගෙන් ලද පෙත්සම් 34 ක් අදාල ආයතන වෙත මෙම අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව යොමු කිරීම. |
| 04 | පළාත් සභාවන් සඳහා වාහන මිලදී ගැනීම. | ලද ඉල්ලීම් 14 ක් පරීක්ෂා කර බලා සුදුසු නිර්දේශ ලබා දී අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම් වලින් 05 ක් සඳහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇත. |
| 05 | පළාත්සභා ධුරයන්ගෙන් වරප්‍රසාද හා පහසුකම් සැලසීම. | මියගිය පළාත් සභා මන්ත්‍රීවරුන් 04 දෙනෙකු වෙනුවෙන් වාහන ආනයන බලපත්‍ර ලබා දීමට අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශ ඉදිරිපත් කිරිම. ඉන් 03 ක් සඳහා අනුමැතිය ලැබී ඇත.<br>වරප්‍රසාද පහසුකම් සඳහා ලද ඉල්ලීම් 12 ක් සඳහා මෙම අමාත්‍යාංශයේ නිර්දේශය අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම. |
| 06 | ප්‍රධාන ලේකම්වරුන්ගේ රැස්වීම පැවැත්වීම | රැස්වීම් වාර 07 ක් පවත්වා ඇත. |

## 9.3 නීති අංශය

පිළිගත් ජාතික ප්‍රතිපත්ති ව්‍යුහයක් තුල මහජන ශුභ සිද්ධිය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාර පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන පරිපාලනමය හා සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, මග පෙන්වීම, නීතිමය, තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාදීම මෙහෙවර කොට ගත් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ නෛතිකමය කාර්යභාරය වඩාත් ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කරලීම උදෙසා අමාත්‍යාංශයීය නීති අංශය ස්ථාපිත කර ඇත.

### 9.3.1 කාර්යභාරය

01. උප ජාතික පාලනයේ දෙවන හා තෙවන ස්ථර අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාමේදී උද්ගත වන නෛතිකමය ගැටළු සම්බන්ධව මැදිහත් වීම, එහිදී පවත්නා නීතීන් හා අනු නීතීන් සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව නව නීතීන් හා අනු නීතීන් සැකසීමට අදාල කටයුතු කිරීම.

02. පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුල උද්ගත වන නෛතිකමය ගැටළු සම්බන්ධව උපදෙස් ලබා දීම.

03. අමාත්‍යාංශයට එරෙහිව අධිකරණයේ ගොනු කරනු ලබන පෙත්සම් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම.

04. පහළ අධිකරණ කටයුතු වලට සහභාගී වීම සහ අමාත්‍යාංශය නියෝජනය කිරීම.

05. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කරනු ලබන පෙත්සම්වලට අදාල කටයුතු කිරීම.

### 9.3.2 නීති අංශයේ 2014 වර්ෂයේ ප්‍රගතිය

නීති අංශය මගින් මෙම වර්ෂයේදී සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත සංශෝධනය හා ජලභීතිකා පනත සංශෝධනය කිරීමේ කෙටුම්පත් යෝජනාවලියක් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එසේම පළාත් පාලන අයවැය සම්බන්ධ වූ මහ නගර සභා, නගරසභා සහ ප්‍රාදේශීය සභා පනත හා පළාත් පාලන ආයතන වල පුරප්පාඩු පිරවීම (විශේෂ විධි විධාන) පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගෙන ඇත. සංචාරක ව්‍යාපාරයේ නිරත හෝටල්, ආපන ශාලා, නවාතැන් පොළවල් සම්බන්ධව මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත් සංශෝධනය හා ගෝසාතක ආඥා පනත සංශෝධන කිරීමට අදාලව කටයුතු කරමින් පවතී.

## 9.4 සංවර්ධන හා සැලසුම් අංශය

දිවයිනේ විවිධ පළාත් වල ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් වේ. එකී සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම, ඊට අදාල ප්‍රගති සමාලෝචන හා සාකච්ඡා ජාතික මට්ටමින් පැවැත්වීම, පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ කාර්යභාරයන්ට අදාල අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තා ඇතුළු ප්‍රගති විමර්ශන වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සංවර්ධන හා සැලසුම් අංශය මගින් කෙරෙන ප්‍රධාන කාර්යයන් වේ.

### 9.4.1 පළාත් පාලන ආයතන සතු පුස්තකාල සංවර්ධනය

දිවයිනේ පළාත් පාලන ආයතන සතු අඩුපාඩුකම් සහිත මහජන පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා 2014 වසර තුල රුපියල් මිලියන 16.2 ක ශුද්ධ ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ අයවැය යටතේ වෙන් කරන ලදී. පවතින ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් ප්‍රමුඛතාවය මත එක් පළාතකින් අඩු පහසුකම් සහිත අත්‍යාවශ්‍යයෙන්ම දියුණු කළයුතු පුස්තකාල පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය මත තෝරා ගෙන එම පුස්තකාල සඳහා පොත්පත් ලබා දීම, කාර්යාලීය ලී බඩු සහ උපකරණ ලබා දීම පරිගණක හා උපාංග ලබාදීම, සීඩී පට ලබාදීම හා පුස්තකාලවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම වැනි කාර්යයන් මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතිය | පළාත් පාලන ආයතන | 2014 භෞතික ප්‍රගතිය % | 2014 මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල සඳහා උපකරණ ලබාදීම | වැලිගෙපොළ ප්‍රා.ස<br>හොරොව්පතාන ප්‍රා.ස<br>උඩුනුවර ප්‍රා.ස<br>කයිට්ස් ප්‍රා.ස<br>පාලින්දනුවර ප්‍රා.ස<br>වැලිකන්ද ප්‍රා.ස<br>වීරකැටිය ප්‍රා.ස<br>පුත්තලම ප්‍රා.ස<br>තිරුක්කෝවිල් ප්‍රා.ස | 100 | 100 |
| 02 | විද්‍යුත් පුස්තකාල සඳහා උපකරණ ලබා දීම | ත්‍රිකුණාමලය න.ස<br>ගල්ගමුව ප්‍රා.ස<br>බිබිල ප්‍රා.ස<br>ගාල්ල ම.න.ස<br>කුළියාපිටිය න.ස<br>සබරගමුව මධ්‍යම පුස්තකාලය<br>අක්කරෙයිපත්තු ම.න.ස | 100<br>75 | 71.16 |
| 03 | මහජන පුස්තකාල ඉදි කිරීම් (පුස්තකාල ගොඩනැගිල්ලේ මූලික වැඩ කටයුතු සඳහා ) | ගලේවෙල ප්‍රා.ස | 100 | |

**2014 වර්ෂයට අදාල සමස්ථ මූල්‍ය ප්‍රගතිය**

| ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| 16.2 | 14.51 | 89.5 |

### 9.4.2 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සහ වැඩසටහන - 2014

මෙම අමාත්‍යාංශයේ මූලිකත්වයයෙන් සහ මෙහෙයවීමෙන් සියළුම පළාත් සභා නියෝජනය කරමින් 2014 වසරේ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුළියාපිටිය වයඹ විශ්ව විද්‍යාලය, කාර්මික විද්‍යාලය සහ මධ්‍ය විද්‍යාල යන භූමි වල පැවති අතර, ඒ සඳහා පළාත් සභා පර්ෂදය ලෙස මෙම අමාත්‍යාංශය සාර්ථකව සහභාගි විය.

මේ යටතේ වයඹ පළාතේ සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග කි.මී.70 ක් ප්‍රතිසංස්කරණය කළ අතර එම ආයතනවලට සුදු යකඩ ජල බවුසර් 33 ක්, බහුකාර්ය ජංගම කුටි 448 ක්, කොම්පොස්ට් බඳුන් 3800 ක් සහ කසළ බඳුන් 3800 (ලීටර් 65) බෙදාදෙන ලදී. මීට අමතරව අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහාද සහාය දක්වන ලදී.

තවද, 2014 වර්ෂයේදී, ඊට පෙර වර්ෂ වල පැවති දැයට කිරුළ ප්‍රදර්ශණයන්ට අදාල සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතුව තිබූ ගෙවීම් කර ඇත.

මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘති සඳහා 2014 වර්ෂයේ දැරූ වියදම පහත සඳහන් වේ.

| වැඩසටහන | ශුද්ධ ප්‍රතිපාදන (රු.මි.) | මූළු වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන | 230 | 220.77 | 96 |



කුළියාපිටිය නගර සභාවේ විද්‍යුත් පුස්තකාලය ස්ථාපිත කිරීම


බෙදාදීමට සූදානම් කර ඇති සුදු යකඩ ජල බවුසර්


රාජාංගනය ප්‍රාදේශිය සභා කාර්යාලය ඉදිකිරීම


මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ පොතානේගම ආදාහනාගරය ඉදිකිරීම

## 9.4.3 කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධනය

නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන ආයතන වල තාක්ෂණික සහ උපදේශාත්මක සහය ඇතිව පළාත් සභාවල ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු සහ පළාත් පාලන කොමසාරිස් කාර්යාල වල මැදිහත් වීම ඇතිව පහත සඳහන් කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන නව අංගයක් බවට පත් වී ඇත.

| නගරය | 2014 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති | 2014 භෞතික ප්‍රගතිය % | 2014 මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| **හක්මණ නගර සංවර්ධනය (2008-2016) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 444.00<br>සමස්ථ වියදම 361.85<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 81% | • ආදාහනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම<br>• වෙළෙඳසැල් පහසුකම් ප්‍රවර්ධනය කිරීම<br>• නාගරික පිවිසුම් මාර්ග ප්‍රතිසංස්කරණය<br>• ක්‍රීඩාගාර උපකරණ මිලදී ගැනීම<br>• නගර ශාලාව ඉදි කිරීම | 100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.60.00<br>සත්‍ය වියදම රු.මි.58.86<br>මූල්‍ය ප්‍රගතිය 98 |
| **දෙහිඕවිට නගර සංවර්ධනය (2010-2014) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 700.00<br>සමස්ථ වියදම 282.30<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 40% | • බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 95 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.85.00<br>සත්‍ය වියදම රු.මි.77.44<br>මූල්‍ය ප්‍රගතිය 91 |
| **පල්ලේපොළ නගර සංවර්ධනය (2010-2016) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 350.00<br>සමස්ථ වියදම 63.27<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 18.1% | • බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම (1 අදියර)<br>• ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අළුත්වැඩියාව<br>• නගරයේ කාණු පද්ධතිය ඉදිකිරීම.<br>• තාක්ෂණික මධ්‍යස්ථානයට පරිගණක උපාංග ලබාදීම. | 85<br>100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.46.00<br>සත්‍ය වියදම රු.මි.38.43<br>මූල්‍ය ප්‍රගතිය 84 |
| **පඩුවස්නුවර නගර සංවර්ධනය (2011-2016) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 350.00<br>සමස්ථ වියදම 177.75<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 50.78% | • බස් නැවතුම්පොළ ඉදිකිරීම. - 2 අදියර<br>• මහජන වැසිකිළි පද්ධතිය ඉදිකිරීම.<br>• ආදාහනාගාරය ඉදිකිරීම. - 2 අදියර<br>• නව පරිපාලන ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම<br>• පෙර පාසල් සංවර්ධන හා ඉදිකිරීම්කටයුතු කිරීම.<br>• පඩුවස්නුවර නගරයේ අතුරු මාර්ග සංවර්ධනය. | 100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.76.00<br>සත්‍ය වියදම රු.මි.75.62<br>මූල්‍ය ප්‍රගතිය 99.5 |

| | | | |
|---|---|---|---|
| **බෙලිඅත්ත නගර සංවර්ධනය** (2011-2016) (රු.මිලියන)<br><br>ව්‍යාපෘති පිරිවැය 638.00<br>සමස්ථ වියදම 116.63<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 18.28% | • නාගරික සේවා මධ්‍යස්ථානයක් ඉදි කිරීම<br>• අම්පිටිය වැව පාරිසරික කලාපයක් වශයෙන් වැඩිදියුණු කිරීම<br>• ළමා උද්‍යානය හා ක්‍රීඩාපිටිය ඉදිකිරීම<br>• බස් නැවතුම්පොළ ඉදි කිරීම | 100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.70.00<br>සත්‍ය වියදම රු.මි.69.90<br>මූල්‍ය ප්‍රගතිය 100 |
| **හොරණ නගර සංවර්ධනය** (2010-2016) (රු.මිලියන)<br><br>ව්‍යාපෘති පිරිවැය 350.00<br>සමස්ථ වියදම 47.33<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 13.5% | • නගර සභා ගොඩනැගිල්ල අළුත්වැඩියාව<br>• නගර ශාලාවට උපකරණ ලබා දීම<br>• වාහන නැවතුම්පොළ ඉදි කිරීම<br>• පරිගණක ලබා දීම<br>• පොදු ක්‍රීඩා පිටිය ඉදි කිරීම<br>• හොරණ නගර සභා මහජන ක්‍රීඩාංගනය අළුත්වැඩියාව සහ ක්‍රීඩාගාරය ඉදි කිරීම | 100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.12.00<br>සත්‍ය වියදම රු.මි.10.4<br>මූල්‍ය ප්‍රගතිය 87 |
| **අක්කරෙයිපත්තුව නගර සංවර්ධනය** (2011-2016) (රු.මිලියන)<br><br>ව්‍යාපෘති පිරිවැය 350.00<br>සමස්ථ වියදම 416.71<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 119.06% | • පොදු වෙළඳ පොළ ගොඩනැගිල්ල ඉදිකිරීම<br>• මහ නගර සභාවට අයත් කාණු ඉදි කිරීම<br>• මහ නගරශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම<br>• බොබ් කැට් යන්ත්‍රයේ කොටසක් මිලදී ගැනීම<br>• ධූමායන යන්ත්‍ර 05ක් ලබා දීම<br>• පොදු උද්‍යානය වැඩිදියුණු කිරීම<br>• සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම<br>• ප්‍රාදේශීය සභා නව කාර්යාලයට උපකරණ ලබා දීම<br>• නගර ශාලාව ඉදි කිරීම<br>• පොදු පහසුකම් සැපයීම<br>• ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම<br>• අක්කරෙයිපත්තු කලාගාරය අලුත්වැඩියාව<br>• පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම | 85<br>100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.220.00<br>සත්‍ය වියදම රු.මි.188.92<br>මූල්‍ය ප්‍රගතිය 86 |

### 9.4.4 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - අංක 01

ප්‍රමාණවත් ආදායම් මාර්ග නොමැතිවීම නිසා ප්‍රජා යටිතල පහසුකම් වැඩි දියුණු වී නොමැති ප්‍රාදේශීය සභාවල එම පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සහ එමගින් ජනතාවට ලබාදෙන සේවාවන්වල ගුණාත්මකභාවය හා ඵලදායීබව ඉහළ නැංවීම මෙහි මූලික පරමාර්ථය වේ. මෙම වැඩසටහන යටතේ පහත දැක්වෙන ක්ෂේත්‍රයන් ඔස්සේ ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කෙරෙහි අවධානය යොමු කර ඇත.

01 සතිපොළ නඩත්තු කිරීම
02 ළමා උද්‍යාන නඩත්තු කිරීම
03 පොදු වැසිකිළි සහ පොදු සනීපාරක්ෂක කටයුතු කිරීම
04 යන්ත්‍ර උපකරණ නඩත්තුව
05 රථගාල් නඩත්තු කිරීම
06 ප්‍රාදේශීය සභා සතු ස්ථාවර වෙළඳ මධ්‍යස්ථාන විධිමත් කිරීම හා නඩත්තු කිරීම
07 බස් නැවතුම්පොළ විධිමත්ව තබා ගැනීම
08 ආයුර්වේද මධ්‍යස්ථාන සහ ළමා හා මාතෘ සායන විධිමත්ව පවත්වා ගැනීම
09 කාණු පද්ධතිය නඩත්තු කිරීම
10 පාරවල් නඩත්තු කිරීම
11 කැළි කසළ කළමනාකරණය
12 ප්‍රජා ජල ව්‍යාපෘති නඩත්තු කිරීම
13 ජංගම වෙළෙඳාම විධිමත් කිරීම
14 නගර පිරිසිඳු කිරීම හා අලංකරණය
15 ආදාහනාගාර, සුසාන භූමි විධිමත්ව පවත්වා ගැනීම

මූලයාධාර ලබා දී ඇති ප්‍රාදේශීය සභා 264 පහත සඳහන් පරිදි වේ.

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය සභා | මුදල (රු.මි.) |
|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | සීතාවක, කොටිකාවත්ත, හෝමාගම | 14 |
| | ගම්පහ | මීනුවන්ගොඩ, මීරිගම, කටාන, දිවුලපිටිය, ගම්පහ, අත්තනගල, දොම්පේ, බියගම, ජා ඇල, මහර, වත්තල, කැළණිය | 59 |
| | කළුතර | මදුරාවල, බුලත්සිංහල, පාලින්දනුවර, අගලවත්ත, දොඩංගොඩ, වළල්ලාවිට, මතුගම, පානදුර, හොරණ, කළුතර, බේරුවල, බණ්ඩාරගම | 56 |
| මධ්‍යම | මහනුවර | පන්විල, උඩුදුම්බර, පස්භාගකෝරළේ, මැද දුම්බර, ගඟඉහළ කොරළේ, පූජාපිටිය, තුම්පනේ, පාතදුම්බර, මිණිපේ, ගඟවට කෝරළේ, උඩ පළාත, පාතහේවාහැට, හාරිස්පත්තුව, උඩුනුවර, යටිනුවර, අකුරණ, කුණ්ඩසාලේ | 64 |
| | මාතලේ | අඹන්ගඟ, යටවත්ත, ලග්ගල, විල්ගමුව, පල්ලේපොළ, දඹුල්ල, උකුවෙල, රත්තොට, නාවුල, ගලේවෙල, මාතලේ | 45 |
| | නුවරඑළිය | වළපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය, අඹගමුව | 16 |
| දකුණු | ගාල්ල | වැලිවිටිය දිවිතුර, තවලම, නෙළුව, නාගොඩ, යක්කලමුල්ල, නියාගම, ඉමදූව, ඇල්පිටිය, අම්බලන්ගොඩ, කරන්දෙණිය, බද්දේගම, බෙන්තොට, අක්මීමණ, බෝපේ පෝද්දල, බලපිටිය, රත්ගම, හබරාදූව | 65 |

| | | | |
|---|---|---|---|
| | මාතර | කිරින්ද, පුහුල්වැල්ල, මාලිම්බඩ, තිහගොඩ, අතුරලිය, මුලටියන, පස්ගොඩ, පිටබැද්දර, හක්මන, වැලිගම, කොටපොල, කඹුරුපිටිය, අකුරැස්ස, දෙවිනුවර, මාතර, දික්වැල්ල | 64 |
| | හම්බන්තොට | ලුණුගම්වෙහෙර, තංගල්ල, හම්බන්තොට, අඟුණකොළපැලැස්ස, සූරියවැව, බෙලිඅත්ත, කටුවන, තිස්සමහරාමය, අම්බලන්තොට, වීරකැටිය | 41 |
| ඌව | බදුල්ල | මීගහකිවුල, රිදීමාලියද්ද, කන්දෙකැටිය, ලුණුගල, සොරණාතොට, බණ්ඩාරවෙල, බදුල්ල, ඌව පරණගම, ඇල්ල, මහියංගනය, හල්දුම්මුල්ල, හපුතලේ, පස්සර, වැලිමඩ, හාලි ඇල | 59 |
| | මොණරාගල | බඩල්කුඹුර, මැදගම, කතරගම, මඩුල්ල, තණමල්විල, වැල්ලවාය, සියඹලාණ්ඩුව, මොණරාගල, බුත්තල, බිබිල | 41 |
| සබරගමුව | රත්නපුර | අයගම, කොළොන්න, වැලිගෙපොළ, බලන්ගොඩ, නිවිතිගල, කහවත්ත, ඉඹුල්පේ, ඇඹිලිපිටිය, රත්නපුර, පැල්මඩුල්ල, කලවාන, ගොඩකවෙල, කුරුවිට, ඇහැළියගොඩ | 47 |
| | කෑගල්ල | අරණායක, බුලත්කොහුපිටිය, යටියන්තොට, දැරණියගල, කෑගල්ල, දෙහිඕවිට, ගලිගමුව, රඹුක්කන, රුවන්වැල්ල, වරකාපොළ, මාවනැල්ල | 38 |
| වයඹ | කුරුණෑගල | ගිරිබාව, කොබෙයිගනේ, පොල්පිතිගම, රිදිගම, අලව්ව, නිකවැරටිය, පොල්ගහවෙල, පඩුවස්නුවර, මහව, මාවතගම, උඩුබද්දාව, ගල්ගමුව, ඉබ්බාගමුව, වාරියපොළ, පන්නල, කුරුණෑගල, නාරම්මල, බිංගිරිය, කුළියාපිටිය | 69 |
| | පුත්තලම | නවගත්තේගම, කරුවලගස්වැව, වනාතවිල්ලුව, ආණමඩුව, ආරච්චිකට්ටුව, පුත්තලම, හලාවත, නාත්තණ්ඩිය, වෙන්නප්පුව, කල්පිටිය | 39 |
| උතුරු මැද | අනුරාධපුර | කැබිතිගොල්ලෑව, පදවිය, තිරප්පනේ, හොරොව්පතාන, ගලෙන්බිඳුනුවැව, රඹෑව, ඉපලෝගම, මැදවච්චිය, ගල්නෑව, රාජාංගනය, මිහින්තලය, පලාගල, කහටගස්දිගිලිය, නොච්චියාගම, ම.නු.ප, නැ.නු.ප, කැකිරාව, තලාව | 69 |
| | පොළොන්නරුව | වැලිකන්ද, ලංකාපුර, ඇලහැර, හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, දිඹුලාගල, තමන්කඩුව | 28 |
| නැගෙනහිර | මඩකලපුව | මන්මුනයිපත්තු, මන්මුනයි නිරිත, කෝරලෙයිපත්තු, පොරතිව්පත්තු, මන්මුනයි බටහිර, කෝරලෙයිපත්තු උතුර, කෝරලෙයිපත්තු බටහිර, මන්මුනයි දකුණ, එරාවිල් පත්තු | 37 |
| | අම්පාර | අක්කරෙය්පත්තු, ලාහුගල, මහඔය, නාමල්ඔය, පදියතලාව, කාරතිව්, ඉරක්කාමම්, දමන, නින්තවුර්, නවිදන්වෙලි, අලයාදිවෙම්බු, තිරුක්කෝවිල්, දෙහිඅත්තකණ්ඩිය, උහන, අඩ්ඩාලච්චේනයි, පොතුවිල්, සමන්තුරෙයි | 72 |
| | ත්‍රිකුණාමළය | වෙරුගල්, සේරුවිල, ගෝමරන්කඩවල, මොරවැව, පදවි ශ්‍රීපුර, තඹලගමුව, මුතූර්, කින්නියා, කුච්චවේලි, කන්තලේ, නගර හා කඩවත් සතර | 44 |

| | | | |
|---|---|---|---|
| උතුර | යාපනය | වලිකාමම් දකුණ, වාවකච්චේරි, වඩමාරච්චි නිරිත, නල්ලූර්, කයිට්ස්, ඩෙල්ෆ්, වෙලනෙෙ, වලිකාමම් බටහිර, වලිකාමම් උතුර, වලිකාමම් නිරිත, වලිකාමම් නැගෙනහිර, පේදුරුතුඩුව, කරෙයි නගර් | 52 |
| | මන්නාරම | මන්නාරම, නානාට්ටන්, මුසලි, මාන්තෙයි බටහිර | 18 |
| | වව්නියාව | වවුනියාව දකුණ සිංහල, වවුනියාව දකුණ දෙමළ, වවුනියාව උතුර, වෙන්ගලචෙඩ්ඩිකුලම් | 16 |
| **එකතුව** | | | **1,053** |

මේ සඳහා වෙන් කර ඇති ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.1357.4 ක් වන අතර සමස්ථ වියදම රු.මි.1053.8 ක් වේ. මේ අනුව මෙහි මූල්‍ය ප්‍රගතිය 78% ක් වේ.

### 9.4.5 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - අංක 02

පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩටහන යටතේ පහත සඳහන් පරිදි අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

#### (අ). ප්‍රාදේශීය සභාවන්හි යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීම

සතිපොළ, කැලි කසළ කළමනාකරණය, කාණු පද්ධති, අතුරුමාර්ග, ළමා උද්‍යාන, පොදු සනීපාරක්ෂක හා වැසිකිළි පහසුකම් වැනි ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීමට, ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය නොකරන ප්‍රාදේශීය සභාවන්හි සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් එම සභාවල යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීම.

ප්‍රාදේශීය සභාවන්හි අත්‍යාවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා පහත විස්තර වන යන්ත්‍රෝපකරණ 2014 වර්ෂය තුලදී ලබා දී ඇත.

- Backhoe Loader 4wd
- Vibrating Roller 8 Ton
- Motor Grader 100 hp
- Dump truck (Tipper) – 7 Ton
- Trucle Mounted Water Bowser (6000 L)
- Crew Cab Long Wheel Base
- Crew Cab Short Wheel Base
- Tractors
- Road Sweeper
- Truck Mounted Lodder 12 m.
- Slerd Loader 0.5$m^3$
- Walking Steel Roller 700 Kg.

### (ආ). පළාත්වල දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩසටහන

සෑම පළාතකම ප්‍රදේශ ඉලක්ක කරගත් දිළිඳුබව අඩු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් අඩු ආදායම්ලාභී ජනගහනය අනුව ප්‍රතිපාදන සැපයීමට මෙම වැඩසටහන් මගින් යෝජිතය.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම සංවර්ධන වැඩසටහන යටතේ පළාත්වල දිළිඳු පවුල් වැඩිපුර ජීවත්වන ප්‍රදේශවල ජනතාවගේ මූලික අවශ්‍යතා සහ ජීවනෝපාය වැඩිදියුණු කිරිමට සහ පළාත තුළ විවිධ ප්‍රදේශවල පැතිරී ඇති සුළු ව්‍යවසායක කර්මාන්ත වල නියැලෙන ජන කොටස් සහ එම ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් එම කර්මාන්ත නගා සිටුවීම සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගෙන පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- ගව පාලනය - නැගෙනහිර, වයඹ, සබරගමු පළාත්වල අඩු ආදායම්ලාභී පවුල්
- පානීය ජලය - උතුරු මැද, ඌව සහ දකුණු පළාත්
- දේශීය ඇඟළුම් නිෂ්පාදන, මැටි කර්මාන්ත කොහු ආශ්‍රිත නිෂ්පාදන - දකුණු පළාත
- හඳුනාගත් ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනයට

### (ඇ). අඩු ආදායම්ලාභි පළාත් පාලන ආයතන වල සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීම

2013 අයවැය යෝජනා මගින් ඉදිරිපත් කරන ලද අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන වල සංවර්ධන කාර්යන් සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම ආරම්භ කරන ලද අතර මේ යටතේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන වල සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සහාය ලබාදීමට පියවර ගන්නා ලදී.

මෙම වැඩසටහනෙහි පරමාර්ථය වන්නේ මෙකී පළාත් පාලන ආයතනවල සිය වාර්ෂික ආදායම රු.මි. 10 දක්වා ලඟාකර ගැනීම සහ එම බල ප්‍රදේශ වල අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීමත් වේ.

**ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

- සතිපොළ හා කුඩා වෙළෙඳ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය.
- පුස්තකාල/සෞඛ්‍ය මධ්‍යස්ථාන/ආයුර්වේද මධ්‍යස්ථාන සේවා පියස සහ සම්මන්ත්‍රණ ශාලා ඉදි කිරීම.
- කුඩා ජල යෝජනා ව්‍යාපෘති සංවර්ධනය කිරීම.
- වාහන නැවතුම්පොළ හා රථගාල් ඉදි කිරීම.
- පොදු ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම.
- උද්‍යාන/නිවාඩු නිකේතන සංවර්ධනය කිරීම.
- ආදාහනාගාර හා මිහිදන් උද්‍යාන සංවර්ධනය කිරීම.
- සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
- පරිපාලන කාර්යාල වැඩිදියුණු කිරීම.
- වෙනත් අදාල විවිධ කාර්යන් සඳහා.

**මෙම වැඩසටහන යටතේ 2014 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් හා ප්‍රගතිය සඳහන් වේ.**

| අනු අංකය | වැඩසටහන | මුළු වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය% | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|
| 01 | බහුකාර්ය කුටි 820 ක් මිලදී ගැනීම | 24.77 | 95 | 100 |
| 02 | සුදු යකඩ ජල බවුසර් මිලදී ගැනීම සඳහා | 58.58 | - | 100 |
| 03 | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් | 2,732.58 | 25 | 100 |
| 04 | පළාත් පාලන ආයතන වල සංවර්ධන කාර්යයන් සඳහා මූල්‍ය සහාය ලබාදීම. | 224.22 | 79 | 100 |
| 05 | දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන සඳහා | 171.46 | 83 | 100 |
| 06 | දැයට කිරුළ සමගාමීව සිදු කරන ලද සංවර්ධන කාර්යයන් | 3.46 | 93 | 100 |
| 07 | මෙම කාර්යයන් හා බැඳුනු වෙනත් කාර්යන් සඳහා | 0.27 | - | - |
| **එකතුව** | | 3,215.34 | | |

| | **මුළු ශුද්ධ ප්‍රතිපාදන (රු.මි.)** | **මුළු වියදම (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය %** | **භෞතික ප්‍රගතිය %** |
|---|---|---|---|---|
| මෙම වැඩසටහන් 03 සඳහා | 3,215.50 | 3,215.34 | 100 | ඉහත පරිදි වේ. |

### 9.4.6 හදිසි ප්‍රතිචාර සඳහා ධාරිතා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - පියවර iii

මෙම වර්ෂය තුළ යාපනය, මඩකලපුව සහ අක්කරෙයිපත්තු මහ නගර සභාවල මෙන්ම අම්පාර නගර සභාවට දේශීය අරමුදල් යොදා ගනිමින් ගිනි නිවීමේ යන්ත්‍රෝපකරණ ලබාදීම සහ අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කරන ලද අතර එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| ශුද්ධ ප්‍රතිපාදන (රු.මි.) | මුළු වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 259 | 219.22 | 85 | 90 |

### 9.4.7 උතුරු සහ නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම්

මෙම වැඩසටහන යටතේ උතුරු නැගෙනහිර පලාත් වල පළාත් පාලන ආයතන වල ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සිදු කරන ලද අතර එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| ශුද්ධ ප්‍රතිපාදන (රු.මි.) | මුළු වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 48 | 47.47 | 99 | 80 |

මෙම වැඩසටහන යටතේ සිදු කරන ලද කාර්යයන් පහත පරිදිය.

| අනු අංකය | කාර්යයන් | වැය වූ මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදි කිරීම | 0.6 |
| 02 | එරාවූර් නගර සභාවේ ගොඩනැගිලි සඳහා | 3.7 |
| 03 | අම්පාර මහජන ක්‍රීඩාංගනය | 2.0 |
| 04 | ක්‍රීඩාගාරය ඉදි කිරීම - දමන | 0.6 |
| 05 | සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම | 18.2 |
| 06 | ලී බඩු උපකරණ මිලදී ගැනීම - පදවි ශ්‍රීපුර | 0.8 |
| 07 | සමන්තුරේ ප්‍රා.ස. ගොඩනැගිල්ල ඉදි කිරීම | 5.0 |
| 08 | එරාවූර් නගර ශාලාව ඉදි කිරීම | 4.5 |
| 09 | පොතුවිල් ප්‍රා.ස ගොඩනැගිල්ල ඉදි කිරීම | 8.7 |
| 10 | විදුලිය ලබා ගැනීම - අඩාලච්චේන | 3.3 |
| **එකතුව** | | 47.4 |

## 9.4.8 ස්වයං රැකියා උත්පාදන ව්‍යාපෘතිය

මෙම වැඩසටහන යටතේ ස්වයං රැකියා උත්පාදනය වැඩිදියුණු කිරීම සඳහා 2014 වර්ෂයේදි පා පැදි 2100 ක් ලබා දී ඇත. සත්‍ය වශයෙන් කල වැඩසටහන් මත මූල්‍ය හා භෞතික ප්‍රගතිය සඳහන් කර ඇත.

| ශුද්ධ ප්‍රතිපාදන (රු.මි) | මුළු වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|
| 30.00 | 13.31 | 44 | 100 |

## 9.4.9 දත්ත පද්ධතියක් සකස් කිරීම

අමාත්‍යාංශයේ කටයුතු සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු සිදු කරමින් පවතී. මේ සඳහා 2014 වර්ෂයට අදාල වියදම පහත පරිදි වේ.

| ශුද්ධ ප්‍රතිපාදන (රු.මි.) | මුළු වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 30.00 | 1.89 | 63 | මූලික අදියරේ වැඩ කටයුතු සිදු කරමින් පවතී. |

## 9.5 අපද්‍රව්‍ය කළමනාකරණය

**දැක්ම**

සැමට වඩාත් සුවදායී පරිසරයක්

**අරමුණ**

පළාත් පාලන බල ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**ප්‍රතිපත්ති හා උපායමාර්ග :**

**01. කසළ ජනනය අවම කිරීම**

ගෘහස්ථ වාණිජ හා කාර්මික අංශයන්හි කසළ ජනනය අවම කිරීම පිණිස පාර්ශ්වකරුවන් දිරිගැන්වීම සඳහා විවිධ ක්‍රමෝපායන් හඳුන්වා දීම.

**02. සම්පත් ප්‍රතිජනනය උපරිම කිරීම**

- කසළ ජනනය වන ස්ථානයේදීම වර්ගීකරණය කිරීම.
- දිරායන අපද්‍රව්‍ය වලින් නිවසේදීම කොම්පෝස්ට් නිපදවීමට නිවැසියන් යොමු කිරීම.
- පළාත් පාලන ආයතන මඟින් නගර කේන්ද්‍රකර ගත් කොම්පෝස්ට් මධ්‍යස්ථාන ඇති කිරීම.
- කසළ ප්‍රතිචක්‍රීයකරණය ක්‍රම හඳුන්වා දීම හා ජනතාව දිරි ගැන්වීම.

**03. සනීපාරක්ෂක බිම් පිරවුම් හඳුන්වා දීම**

## 9.5.1 අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති බල ප්‍රදේශය | සත්‍ය වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| පරිසර සංරක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (කොම්පෝස්ට් අංගනයන් ස්ථාපිත කිරීම, වැඩිදියුණු කිරීම හා කොම්පෝස්ට් ව්‍යාපෘති හා ඒ ආශ්‍රිත ආරක්ෂක වැට, සේවක විවේකාගාරය සකස් කිරීම) | කල්පිටිය ප්‍රා.ස | 2.85 | 100 |
| | කින්නියා න.ස | 2.64 | 100 |
| | තවලම ප්‍රා.ස | - | 30 |
| | නුවරගම් පළාත ප්‍රා.ස | 3.57 | 100 |
| | මිනිපේ ප්‍රා.ස | 0.13 | 100 |
| | නුවරඑළිය ප්‍රා.ස | 6.05 | 100 |
| | මන්නාරම ප්‍රා.ස | 5.79 | 100 |
| | පැල්මඩුල්ල ප්‍රා.ස | 5.57 | 100 |
| | බුත්තල ප්‍රා.ස | 0.50 | 100 |
| | ත්‍රිකුණාමළය න.ස | 0.62 | 100 |
| | නාත්තණ්ඩිය ප්‍රා.ස | 4.13 | 100 |
| | මහියංගනය ප්‍රා.ස | 6.37 | 100 |
| | ඌව පරණගම ප්‍රා.ස | 5.08 | 100 |
| | කතරගම ප්‍රා.ස | 0.04 | 100 |
| | කින්නියා ප්‍රා.ස | 1.86 | 100 |
| කාබනික පොහොර සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධයෙන් තාක්ෂණික වැඩමුළු හා පුහුණුව සඳහා | මඩකළපුව දිස්ත්‍රික්කය | 0.20 | 100 |
| | වෙනත් | 0.11 | 100 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තරඟය | | 2.66 | 100 |
| කොම්පෝස්ට් බඳුන් හා කසළ වෙන් කිරීමේ බඳුන් ලබා දීම | කින්නියා ප්‍රා.ස | 0.18 | 100 |
| | කුච්චවේලි ප්‍රා.ස | 1.64 | 100 |
| | පාතදුම්බර ප්‍රා.ස | 0.02 | 100 |
| | තලවකැලේ ලිඳුල න.ස | 0.05 | 100 |
| | උඩුනුවර ප්‍රා.ස | 0.10 | 100 |
| | කතරගම ප්‍රා.ස | 0.29 | 100 |
| | ප.පා.ආයතන 34 සඳහා | 11.04 | |
| ඩෙංගු වැඩසටහන | | 2.73 | 100 |
| අමාත්‍යාංශ පරිශ්‍රයේ ජීවවායු ඒකකය ස්ථාපනය කිරීම | | 0.04 | 100 |
| සංවෘත කසළ දාහක ස්ථාපිත කිරීම | | 2.59 | 100 |
| කම්පැක්ටර් රථ 03ක් මිලදී ගැනීම | | 3.98 | - |
| දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව පාසැල් දරුවන් සඳහා පවත්වන චිත්‍ර තරඟය - 2014 ත්‍යාග ප්‍රදානය | | 0.09 | 100 |
| පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව | | 3.00 | 100 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව ගුවන් විදුලි වැඩසටහන් | | 0.8 | 100 |
| **මුළු එකතුව** | | **74.72** | |

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කල මුදල රු.මිලියන 75 ක් වන අතර සමස්ථ වියදම රු.මිලියන 74.72 ක් වේ. මේ අනුව මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය 99.6% ක් වේ.





මන්නාරම නගර සභාව - පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානය



මිණිපේ ප්‍රාදේශීය සභාව - පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානය



කාබනික පොහොර නිෂ්පාදනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ එක්දින පුහුණු වැඩමුළුව සබරගමුව පළාත

## ගෘහස්ථ කොම්පෝස්ට්කරණය පිළිබඳ නිවාසලාභීන් දැනුවත් කිරීම්



අලව්ව ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුලදී



පොල්පිතිගම ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුලදී

## 9.6 විමංසන අංශය

### 9.6.1 පළාත් සභා ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය

පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් කිරීම විමංසන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යය සඳහා මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානය, පළාත් සභා ඇස්තමේන්තු, සත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු උපයෝගී කර ගනී. මෙම තොරතුරු විමංසනය තුළින් මතුවන විචල්‍යතා හා ගැටළු පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට ලක්කිරීමට කටයුතු කරන අතර, එමඟින් තම මූල්‍ය කටයුතුවල අපේක්ෂිත ඉලක්කයන් කරා පළාත් සභා යොමු කරවීම අරමුණු කෙරේ.

ඒ අනුව 2012, 2013 සහ 2014 වර්ෂ වලදී පළාත් සභා වෙතින් ලබා ගත් තොරතුරු අනුව පිළියෙල කරන ලද පළාත් සභා ක්ෂේත්‍රයේ මුල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ). මධ්‍යම රජයේ ප්‍රදාන හා එම ප්‍රදාන මුදා හැරීම්

(රු.මි.)

| | 2012 | | | 2013 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රදාන වර්ගය** | **ඇස්ත-මේන්තුව** | **සත්‍ය** | **%** | **ඇස්ත-මේන්තුව** | **සත්‍ය** | **%** | **ඇස්ත-මේන්තුව** | **2014.12.31 දිනට මුදා හැරීම්** | **%** |
| **(අ).පුනරාවර්තන වියදම** (සාමූහික ප්‍රදාන) | 94,877 | 91,551 | 96 | 108,765 | 97,713 | 90 | 126,144 | 126,144 | 100 |
| **(අ). මුළු පුනරාවර්තන ප්‍රදාන** | **94,877** | **91,551** | **96** | **108,765** | **97,713** | **90** | **126,144** | **126,144** | **100** |
| **(ආ).ප්‍රාග්ධන ප්‍රදාන** | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන | 4,375 | 2,859 | 65 | 2,390 | 2,284 | 96 | 3,874 | 2,180 | 56 |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 13,520 | 6,409 | 47 | 16,609 | 6,720 | 40 | 12,921 | 9,254 | 72 |
| **(ආ) මුළු ප්‍රාග්ධන ප්‍රදාන** | **17,895** | **9,268** | **52** | **18,999** | **9,004** | **47** | **16,795** | **11,434** | **68** |
| **මුළු ප්‍රදාන (අ+ආ)** | **112,772** | **100,819** | **89** | **127,764** | **106,717** | **84** | **142,939** | **137,578** | **96** |

(ආ). පළාත් සභා මුළු ආදායම

(රු.මි.)

| ආදායම් වර්ගය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|
| | ඇස්ත-මේන්තුව | 2012.12.31 දිනට සත්‍ය ආදායම් | ඇස්ත-මේන්තුව | 2013.12.31 දිනට සත්‍ය ආදායම් | ඇස්ත-මේන්තුව | 2014.12.31 දිනට සත්‍ය ආදායම් |
| පිරිවැටුම් බදු | 635 | 188 | 81 | 117 | 73 | 298 |
| වාහන බලපත්‍ර ගාස්තු | 4,737 | 5,142 | 5,090 | 6,588 | 6,497 | 7,481 |
| මත්පැන් බලපත්‍ර ගාස්තු | 658 | 794 | 756 | 835 | 965 | 942 |
| පොළී | 1,430 | 1,921 | 1,184 | 1,884 | 1,387 | 1,409 |
| උසාවි දඩ | 1,673 | 1,890 | 1,621 | 1,891 | 2,033 | 1,841 |
| මුද්දර ගාස්තු | 6,266 | 6,458 | 7,636 | 6,678 | 18,527 | 20,608 |
| අනෙකුත් | 36,006 | 32,842 | 42,264 | 31,655 | 31,011 | 26,555 |
| **මුළු ආදායම** | **51,405** | **49,235** | **58,632** | **49,648** | **60,493** | **59,134** |

(ඇ). පළාත් සභාවන්හි පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම

(රු.මි.)

| වියදමේ ස්වභාවය | 2012 | | | 2013 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්ත-මේන්තුව | 2012.12.31 දිනට සත්‍ය වියදම් | % | ඇස්ත-මේන්තුව | 2013.12.31 දිනට සත්‍ය වියදම් | % | ඇස්ත-මේන්තුව | 2014.12.31 දිනට සත්‍ය වියදම් | % |
| **(අ).පුනරාවර්තන වියදම** | 145,229 | 139,120 | 96 | 162,897 | 154,137 | 95 | 179,149 | 172,130 | 96 |
| **(ආ).ප්‍රාග්ධන වියදම** | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන | 10,445 | 8,223 | 79 | 10,187 | 8,030 | 79 | 13,004 | 10,249 | 79 |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන * | 13,520 | 8,866 | 66 | 10,770 | 8,637 | 80 | 15,629 | 11,661 | 75 |
| **(ආ).ප්‍රාග්ධන වියදම් එකතුව** | **23,965** | **17,089** | **71** | **20,957** | **16,667** | **80** | **28,633** | **21,910** | **77** |
| **මුළු එකතුව (අ+ආ)** | **169,194** | **156,209** | **92** | **183,854** | **170,804** | **93** | **207,782** | **194,040** | **93** |

* - පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අධ්‍යාපනය හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ ප්‍රදානද ඇතුළත් වේ.

## 9.7 ගිණුම් අංශය

අමාත්‍යාංශයට අදාල සමස්ත වැය ප්‍රතිපාදන මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, ගිණුම් තැබීමේ කටයුතු මෙහෙයවීම යනාදිය ගිණුම් අංශය විසින් සිදු කරන අතර මධ්‍යම රජය විසින් පළාත් සභා වලට සාමූහික ප්‍රදාන වශයෙන් පුනරාවර්තන වියදම සඳහා වාර්ෂික අයවැය ලේඛණයෙන් වෙන් කරනු ලබන මුදල ලබාදීම මෙන්ම, පළාත් පාලන ආයතන වලට අවශ්‍ය මූල්‍ය සහය ලබා දීමද මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

### 9.7.1 පළාත් පාලන ආයතනවලට වාහන හා යන්ත්‍රෝපකරණ ලබා දීම

2014 වර්ෂයේ මෙම අංශයේ දායකත්වය ඇතිව අමාත්‍යාංශය විසින් පහත සඳහන් කර ඇති වාහන අදාල පළාත් සඳහා ලබා දීමට කටයුතු කර ඇත.

| අනු අංකය | බෙදා දුන් වාහන වර්ගය | පළාත | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | බස්නාහිර | මධ්‍යම | දකුණු | උතුරු | උතුරුමැද | සබරගමුව | වයඹ | නැගෙනහිර | ඌව | ප. ස.අමාත්‍යා. |
| 01 | නවතම වර්ගයේ ට්‍රැක්ටරයට සවිකළ ගලි බවුසර් 40 | 05 | 03 | 05 | - | 03 | 05 | 10 | 06 | 03 | - |
| 02 | නවතම වර්ගයේ සුදු යකඩ ජල බවුසර් 150 | 04 | 06 | 46 | 05 | 25 | 03 | 28 | 16 | 17 | - |
| 03 | නවතම වර්ගයේ NISSAN NAWARA ඩබල් කැබ්රථ 45 | - | 06 | 01 | 01 | 05 | 05 | 09 | 06 | 09 | 03 |
| 04 | නවතම වර්ගයේ ට්‍රැක්ටරයට සවිකළ කම්පැක්ටර් යන්ත්‍ර 35 | 08 | 05 | 04 | 02 | - | - | 05 | 07 | 04 | - |
| 05 | නවතම වර්ගයේ Mitsubishi L 200 Sportero ඩබල් කැබ්රථ 170 | - | 32 | 40 | 12 | 20 | 22 | 14 | 11 | 16 | 03 |

## 9.8 පාලන අංශය

මෙම අංශය මගින් අමාත්‍යාංශයේ සියළුම පරිපාලන කටයුතු මෙන්ම මානව සම්පත් සංවර්ධන කටයුතුද සිදු කරනු ලබයි. මානව සම්පත් සංවර්ධනය සඳහා වැය වී ඇති මුදල පහත සඳහන් පරිදි වේ.

| ශුද්ධ ප්‍රතිපාදන (රු.මි.) | වැයකල මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 2.00 | 1.99 | 100 | 100 |

# 10 ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති (විදේශ අරමුදල් මත ක්‍රියාත්මක)

ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජනපද ආධාර වැඩසටහන, යුරෝපා සංගමය, ජපන් රජය, නෙදර්ලන්ත රජය, සහ ආසියා පදනම, වැනි විදේශ මූල්‍ය ආයතන මගින් ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සහාය දෙනු ලබන අතර පහත සඳහන් විදේශ මූල්‍ය ආයතන සමඟ සහයෝගය හා සම්බන්ධතාවය ගොඩනඟා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර, ලබා ගත හැකි ණය ආධාර ප්‍රමාණය විශාල වශයෙන් ඉහළ ගොස් තිබේ. 2014 වසර සඳහාද මෙම ව්‍යාපෘති එලෙසම ක්‍රියාත්මක වේ.

## 10.1 ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති

01. "පුර නැගුම" - පළාත් පාලනය නඟා සිටුවීමේ ව්‍යාපෘතිය - Local Government Enhancement Sector Project (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
02. පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (මධ්‍යම හා සබරගමුව පළාත්) – Provincial Roads Project (Central & Sabaragamuwa) (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා පදනම - JICA)
03. පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ඌව, නැගෙනහිර සහ උතුරු පළාත් – Provincial Roads Project (PRP - Uva, Eastern & Northern Provinces) (ලෝක බැංකුව - WB)
04. නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය – Provincial Roads Project (PRP - Eastern & North Central) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
05. උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - Northern Road Connectivity Project (On going & Additional Financing) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
06. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - Greater Colombo Waste Water Management Project (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
07. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය – Transforming the school Education System as the Foundation of a knowledge Hub Project (ලෝක බැංකුව - WB)

08. යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය – Jaffna Killinochchi Water Supply Sanitation Project) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)

09. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය – Iranamadu Irrigation Development Project (IFAD)

10. ද්විතීක සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය – Second Health Sector Development Project (ලෝක බැංකුව - WB)

11. හදිසි අවස්ථා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය-2 අදියර – Upgrading the Disaster Response Network Phase ii (නෙදර්ලන්ත රජය - Govt. of Netherland)

12. කොරියානු පාරිසරික ආයතනයෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කරන ලද කසළ ජනනය වන ස්ථානයේදීම බෙදා වෙන් කිරීම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය – Promoting Point Source Seperation of Household Solid Waste Sustainable Waste Management

13. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ පරිමා පාදක කරගත් ගෙවීම් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන – Volume Based Waste fee System in Western Province

## 10.2 පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ග ක්ෂේත්‍රය සඳහා වූ දැවැන්ත සංවර්ධන සහාය

පළාත් මාර්ග සංවර්ධනය යටතේ ආසියානු සංවර්ධන බැංකුව (ADB) ආධාර සපයන පළාත් මාර්ග ව්‍යාපෘතිය මඟින් මේ වන විට නැගෙනහිර පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 163 ක් හා උතුරු මැද පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 220න් 100% ක වැඩ 2014.12.31 දින වන විට නිම කර ඇත.

එසේම ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය මුදල් යටතේ ක්‍රියාත්මක කෙරෙන උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතියේ තෝරාගත් කි.මී. 142න් 98% ක හා අතිරේක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කෙරෙන උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතියේ තෝරාගත් කි.මී. 125 න් 92% ක වැඩ මේ වන විට නිමකර ඇත.

ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) ණය මුදල් සපයන පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 164 හි සබරගමුව පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 145න් 87% ක වැඩ මේ වර්ෂය වන විට නිමකර ඇත.

### (අ). ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ණය ආධාර ලබා දෙන ආයතනය | දිග (කිලෝ මීටර්) |
|---|---|---|
| (අ). නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධනය කිරීම | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 383 |
| (ආ). පළාත් මාර්ග වැඩිදියුණු කිරීම (නැගෙනහිර, උතුර, ඌව පළාත්) | ලෝක බැංකුව (WB) | 236 |
| (ඇ). පළාත් මාර්ග සංවර්ධනය කිරීම (සබරගමුව, මධ්‍යම පළාත්) | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව (JICA) | 309 |
| (ඈ). උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 142 |
| (ඉ). උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 125 |
| **එකතුව** | | **1,195** |

# 11 ව්‍යාපෘති මාලාව

## 11.1 "පුර නැගුම" පළාත් පාලන ආයතන නගාසිටුවීමේ ව්‍යාපෘතිය (Local Government Enhancement Sector Project) – (LGESP)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු** : පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් ප්‍රතිනිර්මාණය කිරීම සහ පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ 108 ක් තුළ කුඩා නගර 108 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**ව්‍යාපෘති සංරචක** : මෙය කුඩා නගර දියුණුකිරීමේ වැඩසටහනකි. මෙම ව්‍යාපෘතිය යටතේ සතිපොළවල්, වෙළඳ සංකීර්ණ, ළමා උද්‍යාන, පුස්තකාල, රථගාල්, ගිමන්හල්, සෞඛ්‍ය හා මාතෘ සායන, ප්‍රජා හා තොරතුරු මධ්‍යස්ථාන, ජල ව්‍යාපෘති, සුසාන භූමි, ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිලි ආදිය ඉදි කිරීම කරනු ලැබේ.


**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 8,596
**ව්‍යාපෘති කාලය** : 2012 - 2016
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 1675
**2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 19%
**2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 63%

මෙම ව්‍යාපෘතිය යටතේ දිවයිනේ පසුගාමී පළාත් පාලන ආයතන 108 කට අයත් බල ප්‍රදේශ වල තෝරා ගත් නගර 108 ක් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කෙරේ.

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| 1699.28 | 1262.77 | 74 |

## ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්




මධ්‍යම පළාතේ පන්විල, හුළුගඟ පාලම ඉදිකිරීමට පෙර සහ ඉදිකිරීමෙන් පසු



බිංගිරිය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම



ගල්නෑව සතිපොළ ඉදිකිරීම




රිදීගම ප්‍රාදේශීය සභා ඉදිරිපස කාර්යාලය ස්ථාපිත කිරීම

## 11.2 පළාත් පාලන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (Provincial Road Development Project) මධ්‍යම හා සබරගමුව පළාත්වල (PRDP - Central & Sabaragamuwa Provinces)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA)**

**ව්‍යාපෘති අරමුණු** : පළාත් මාර්ග (සී සහ ඩී පංතියේ මාර්ග) පුනරුත්ථාපනය කිරීම සහ සේවා තත්ත්වය උසස් කිරීම මඟින් විශ්වාසනීය මාර්ග ජාලයක් ඇති කිරීම හා එමඟින් දේශීය ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය සැපයීම හා ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සහ පළාත් සභාවල මාර්ග සම්බන්ධ ආයතනවල සහ මාර්ග කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම යනාදිය වේ.

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 14,212
**ව්‍යාපෘති කාලය** : 2010-2015
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 10,598
**2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 75%
**2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 87%



| ව්‍යාපෘති ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| සබරගමු පළාත | 145 |
| මධ්‍යම පළාත | 164 |
| **එකතුව** | **309** |

## 2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘති ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සබරගමු පළාත | 2,135.0 | 1,982.93 | 93 |
| මධ්‍යම පළාත | 2,278.7 | 2,277.89 | 100 |
| සම්බන්ධීකරණ ඒකකය | 538.0 | 494.22 | 92 |
| **එකතුව** | **4,951.7** | **4,755.04** | **96** |

### ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්





*මධ්‍යම පළාතේ කරල්ලියද්ද - පුටුහපුව මාර්ගය සංවර්ධනය කිරීම*





*පනාවල මානියන්ගම මාර්ගය සංවර්ධනය කිරීම,*
*සබරගමුව පළාත*

## 11.3 පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Provincial Road Improvement Project) ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල (PRP - Uva, Northern, Eastern Provinces)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ලෝක බැංකුව (WB)**

**මූලික අරමුණු** : ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල සමාජීය සහ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමෙන්, එම පළාත්වල ස්වයංපෝෂිත ආර්ථික රටාව වැඩිදියුණු කිරීම වේ.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 12,053.75
**ව්‍යාපෘති කාලය** : 2010-2015
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 11,853
**2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 98%
**2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 97%



| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| ඌව පළාත | 124 |
| නැගෙනහිර පළාත (අම්පාර) | 56 |
| උතුරු පළාත (යාපනය) | 56 |
| **එකතුව** | **236** |

### 2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | 474.84 | 451.39 | 95 |
| ඌව පළාත | 1,810.00 | 1,599.87 | 88 |
| උතුරු පළාත | 909.40 | 811.16 | 89 |
| සම්බන්ධීකරණ ඒකකය | 81.00 | 69.31 | 86 |
| **එකතුව** | **3,275.24** | **2,931.73** | **90** |

### ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්



*කෝට්ටෙගොඩ - මාස්පන්න - යලගමුව මාර්ගය සංවර්ධනය කිරීම, ඌව පළාත*



*දමන - පන්නලගම මාර්ගය සංවර්ධනය කිරීම, නැගෙනහිර පළාත*




*තිරුනවේලි - පුතූර් මාර්ගය සංවර්ධනය, උතුරු පළාත*

## 11.4 නැගෙනහිර සහ උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතිය (Eastern & North Central Provincial Road Project)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු** : දරිද්‍රතාවයෙන් යුත් සහ යුද්ධයෙන් පීඩිත පළාත් දෙකෙහි මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මඟින් එහි සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීම සහ උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල පළාත් මාර්ග සංවර්ධන ආයතන ශක්තිමත් කිරීම.



**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 8,868.15
**ව්‍යාපෘති කාලය** : 2009 - 2014
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 8,420
**2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 95%
**2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 100%

| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මි.) |
|---|---|
| නැගෙනහිර පළාත | 163 |
| උතුරු මැද පළාත | 220 |
| **එකතුව** | **383** |

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | 550.66 | 469.56 | 85 |
| උතුරු මැද පළාත | 306.40 | 188.48 | 62 |
| සම්බන්ධීකරණ ඒකකය | 5.50 | 2.86 | 52 |
| **එකතුව** | **862.56** | **660.90** | **77** |

### ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්



*කටුව - බණ්ඩාරඋල්පත - කපුගොල්ලෑව - හොරොව්පොතාන මාර්ගය සහ පාලම සංවර්ධනය කිරීම - උතුරු මැද පළාත*




*මැදිරිගිරිය - මීගහවැව මාර්ගය සංවර්ධනය කිරීම - උතුරු මැද පළාත*



ඔයාමඩුව - තන්තිරිමලේ මාර්ගය සංවර්ධනය කිරීම - උතුරු මැද පළාත




ඕලුකරද - ගනේවල්පොල මාර්ගය සංවර්ධනය කිරීම - නැගෙනහිර පළාත

## 11.5 (I) උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය - (දැනට ක්‍රියාත්මක) (Northern Road Connectivity Project - on going)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු :** උතුරු පළාත තුළ වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙකෙහි ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම මඟින් පළාත තුළ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.



**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 3,074
**ව්‍යාපෘති කාලය** : 2010 - 2015
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 2,302
**2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 75%
**2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 98%

| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මි.) |
|---|---|
| උතුරු පළාත | 142 |
| එකතුව | 142 |

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 417.0 | 335.92 | 81 |
| සම්බන්ධීකරණ ඒකකය | 10.5 | 10.03 | 96 |
| එකතුව | 427.5 | 345.95 | 81 |

## ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්



ඉරට්පෙරියකුලම් - පුත්තූර් මාර්ගය සංවර්ධනය කිරීම - උතුරු පළාත



ඔලෙයිතෝඩුවේයි මාර්ගය සංවර්ධනය කිරීම - උතුරු පළාත

## 11.5 (II) උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය - (අතිරේක ප්‍රතිපාදන මත) (Northern Road Connectivity Project - Additional Financing)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු :** උතුරු පළාත තුළ කිළිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්ක දෙකෙහි සහ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මගින් පළාත තුල අභ්‍යන්තර සම්බන්ධතාවය වැඩිදියුනු කිරීම සහ පළාත් මාර්ග සංවර්ධන ආයතනයන් ශක්තිමත් කිරීම.

| | | |
|---|---|---|
| **ව්‍යාපෘති පිරිවැය** | : | රු.මිළියන 2,517.40 |
| **ව්‍යාපෘති කාලය** | : | 2014 - 2018 |
| **2014.12.31 දිනට මුළු වියදම** | : | රු.මිළියන 1,371 |
| **2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** | : | 54% |
| **2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** | : | 73% |



| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| උතුරු පළාත | 52 |
| උතුරු මැද පළාත | 73 |
| එකතුව | 125 |

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු. මි.) | වියදම (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 1,078.6 | 326.4 | 30 |
| උතුරු මැද පළාත | 1,231.6 | 898.06 | 73 |
| සම්බන්ධීකරණ ඒකකය | 5.8 | 2.4 | 41 |
| එකතුව | 2,316.0 | 1,226.86 | 53 |

**ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්**



සත්ව ගොවිපල සඳහා පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම - කිලිනොච්චිය - උතුරු පළාත



කැබිතිගොල්ලෑව - හඳගල මාර්ගය සංවර්ධනය කිරීම - උතුරු මැද පළාත

## 11.6 මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (Greater Colombo Waste Water Management Project)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු** : කොළඹ සහ දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශ තුළ සහ කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ පවතින අපජල කළමනාකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්** : මේ යටතේ ප්‍රධාන වශයෙන් අපජල පොම්පාගාර 04 ක් ඉදිකිරීම, පොම්පාගාර 07 ක් නවීකරණය කිරීම, පීඩන නළ මාර්ග 02 ක් ඉදිකිරීම, අපජල පද්ධතිය කි.මී. 9 ක් නවීකරණය කිරීම සහ අපජලය මුහුදට බැහැර කරන ප්‍රධාන නල මාර්ග 02 ක් නවීකරණය කිරීම සිදු කෙරේ.

| | | |
|---|---|---|
| **ව්‍යාපෘති පිරිවැය** | : | රු. මිලියන 12,771 |
| **ව්‍යාපෘති කාලය** | : | 2010 - 2017 |
| **2014.12.31 දිනට මුළු වියදම** | : | රු.මිලියන 2,446 |
| **2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** | : | 19% |
| **2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** | : | 48% |

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 1,709 | 1,055 | 62 |
| එකතුව | **1,709** | **1,055** | **62** |

## අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ විවිධ අවස්ථාවන්





මෝදර මුහුදට අපජලය මුදාහරින ප්‍රධාන නලය ප්‍රතිසංස්කරණය

අපජල ප්‍රවාහන පද්ධතිය වැඩි දියුණු කිරීමේ අවස්ථා


## 11.7 දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය (Transforming The School Education System as Foundation of a Knowledge Hub Project)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ලෝක බැංකුව (WB)**

**මූලික අරමුණු** : දැනුම පාදක කරගත් ආර්ථික හා සමාජීය සංවර්ධනයේ පදනම ලෙස ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය හා එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධන කිරීම.

| | | |
|---|---|---|
| **ව්‍යාපෘති පිරිවැය** | : | රු. මිලියන 13,000 |
| **ව්‍යාපෘති කාලය** | : | 2012-2016 |
| **2014.12.31 දිනට මුළු වියදම** | : | රු.මිලියන 5,982 |
| **2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** | : | 46% |
| **2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** | : | 60% |

| **ක්‍රියාත්මක ප්‍රදේශ** |
|---|
| සමස්ත දිවයින පුරා |



ද්විතීය පාසැල් 1000 ක සහ ප්‍රාථමික පාසැල් 1500 ක සංවර්ධන කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කරනු ලැබේ. අමාත්‍යාංශය හා පළාත් සභා අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2014 වසරට අදාළ මූල්‍ය ප්‍රගතිය පහතින් දැක්වේ. **මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් කාර්යයන් දැනටමත් සිදු කරමින් පවතී.**

- මහින්දෝදය විද්‍යාගාර ඉදි කිරීම.
- පාසැල්වල පංති කාමර ඉදි කිරීම.
- කලාප ප්‍රාදේශීය කාර්යාල ඉදි කිරීම.
- පංති කාමර ගොඩනැගිලි සහ කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.

### 2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සම්බන්ධීකරණ ඒකකය | 30 | 29.91 | 100 |
| බස්නාහිර පළාත | 240 | 236.68 | 99 |
| මධ්‍යම පළාත | 280 | 277.21 | 99 |
| දකුණු පළාත | 245 | 241.94 | 99 |
| උතුරු පළාත | 290 | 286.47 | 99 |
| වයඹ පළාත | 280 | 277.21 | 99 |
| උතුරු මැද පළාත | 240 | 237.43 | 99 |
| ඌව පළාත | 285 | 281.47 | 99 |
| සබරගමුව පළාත | 240 | 237.43 | 99 |
| නැගෙනහිර පළාත | 305 | 299.18 | 98 |
| **එකතුව** | **2,435** | **2,404.93** | 99 |

මෙම ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම්



*ගිනිගත්හේන මධ්‍ය විද්‍යාලයේ ඉදිකරන ලද මහින්දෝදය විද්‍යාගාරය - මධ්‍යම පළාත*



*ඉහළ කඩිගමුව මහා විද්‍යාලයේ ඉදිකරන ලද පංති කාමර ගොඩනැගිල්ල - වයඹ පළාත*



*පඬුවස්නුවර කලාප අධ්‍යාපන කාර්යාලය ඉදි කිරීම - වයඹ පළාත*

## 11.8 යාපනය හා කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය Jaffna Killinochchi Water Supply Sanitation Projct

**ආධාර ලබාදෙනු ලබන ආයතනය :** **ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු :** යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම, යාපනය මහ නගර සභා සීමාව තුළ ජනතාව සඳහා සනීපාරක්ෂක යටිතල පහසුකම් හා යාපනය අර්ධද්වීපයේ ජල සැපයුම් කළමනාකරණ වැඩසටහන් ශක්තිමත් කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 1,744
**ව්‍යාපෘති කාලය** : 2012-2016
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 41.51
**2014.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 2.3%

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 800.0 | 8.17 | 1 |
| සම්බන්ධීකරණ ඒකකය | 6.0 | - | - |
| **එකතුව** | **806.0** | **8.17** | **1** |

## 11.9 ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (Iranamadu Irrigation Development Project)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය** : කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD)

**මූලික අරමුණු** : වාරිමාර්ග යටිතල පහසුකම් ඵලදායි හා තිරසාර කළමනාකරණයක් සඳහා දියුණු කිරීම හා ජල හා භූමි ඵලදායිතාවය තිරසාර ලෙස දියුණු කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 3800
**ව්‍යාපෘති කාලය** : 2012 – 2017
**2014.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 829.47
**2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** : 22%
**2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 46%

| ක්‍රියාත්මක ප්‍රදේශ | වාරි මාර්ග (කි.මී.) |
|---|---|
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 288 |

## 2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 690 | 491.26 | 71 |
| සම්බන්ධීකරණ ඒකකය | 06 | - | - |
| එකතුව | 696 | 491.26 | 70.6 |


පරන්තන් වම් ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය


පරන්තන් වම් ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය පාලම ඉදි කිරීම


දකුණ ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය

## 11.10 ද්විතීක සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (Second Health Sector Development Project)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය :** ලෝක බැංකුව (World Bank)

**මූලික අරමුණු :** පෝෂණය සහ බෝ නොවන රෝග සම්බන්ධයෙන් පැන නඟින අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පහසුකම් නංවාලීම.

| | | |
|---|---|---|
| **ව්‍යාපෘති පිරිවැය** | : | රු. මිලියන 26,000 |
| **ව්‍යාපෘති කාලය** | : | 2013-2016 |
| **2014.12.31 දිනට මුළු වියදම** | : | රු.මිලියන 1,609 |
| **2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** | : | 6% |
| **2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** | : | **65%** |

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සියළුම පළාත්වල | 1,620 | 1,609 | 99 |

## 11.11 හදිසි අවස්ථා ප්‍රතිචාර ධාරිතා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2 අදියර (Upgrading the Disaster Response Network Phase II)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : නෙදර්ලන්ත රජය** (Govt. of Netherlands)

**මූලික අරමුණු : හදිසි අවස්ථා ප්‍රතිචාර ධාරිතා සංවර්ධනය කිරීම සහ උතුරු නැගෙනහිර පලාත් පාලනආයතන වල ගොඩනැගිලි ඉදි කිරීම.**

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 398 (2014 වර්ෂයට)
**ව්‍යාපෘති කාලය** : 2014

**2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ( 2 අදියර) | 398 | 397 | 100 |
| **එකතුව** | **398** | **397** | **100** |

## 11.12 කොරියානු පාරිසරික ආයතනයෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කරන ලද කසළ ජනනය වන ස්ථානයේදීම බෙදා වෙන් කිරීම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (Promoting Point Source Seperation of Household Solid Waste Sustainable Waste Management)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය :** කොරියානු පාරිසරික ආයතනය (Korea Environment Corporation)

**මූලික අරමුණු :** මෙරට පළාත් පාලන බල ප්‍රදේශ වල කසළ කළමනාකරණය වැඩිදියුණු කිරීම. මෙම ව්‍යාපෘතිය මගින් කසළ ජනනය අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීයකරණය යන උපාය මාර්ග වලට මුල්තැන දෙමින් පලමු අදියර යටතේ සබරගමුව පළාතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් නිවාස 100ක් පාදක කර ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

| | |
|---|---|
| **ව්‍යාපෘති පිරිවැය** | : රු. මිලියන 1,418 |
| **ව්‍යාපෘති කාලය** | : 2013-2014 |
| **2014.12.31 දිනට මුළු වියදම** | : රු.මිලියන 1,417.90 |
| **2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** | : 100% |
| **2014.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** | : 100% |

**මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් නිවාස 100 ක් සඳහා කොම්පෝස්ට් බඳුන් 100 ක්ද, ප්‍රතිචක්‍රීයකරණ ද්‍රව්‍ය බහාලීම සඳහා ලීටර් 65 ප්ලාස්ටික් බඳුනක් සහ පුවත්පත් සහ කාඩ්බෝඩ් බහාලීම සඳහා පොලිප්‍රොපලීන් මල්ලක් ලබා දී ඇත.**

## 11.13 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ පරිමා පාදක කරගත් ගෙවීම් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන (Voloume Based Waste fee System in Western Province)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය :** කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනය (Multi year Programme a Asian Re-Ciculated Society)

| | |
|---|---|
| **මූලික අරමුණු** | : ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරිමට කටයුතු කිරීම |
| **ව්‍යාපෘති පිරිවැය** | : රු. මිලියන 1.3 |
| **ක්‍රියාත්මක ප්‍රදේශ** | : බස්නාහිර පළාත |

මෙම ව්‍යාපෘතියට අදාල මුදල් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත) වෙත නිදහස් කර ඇති දැනට මෙම වැඩසටහනේ මූලික කාර්යයන් සිදු කරමින් පවතී.

# 12 පළාත් පාලන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

## 12.1 හැඳින්වීම

- පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලනය පිළිබද ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ පනත යටතේ පිහිටුවන ලදී.
- මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලබලයෙන් සාමාජිකයන් 8ක් සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විතය.
- මෙම ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදු කරනු ලැබේ.

### දැක්ම

කළමනාකරණ, උපදේශන, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙහි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ සහ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමේ එකම ආයතනය බවට පත්වෙමින් එමගින් මහජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට උරදීමයි.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රීලංකා ආයතනය පහත සඳහන් අංශවලින් සමන්විතය,

01. ඉංජිනේරු අංශය
02. මූල්‍ය කළමනාකරණ අංශය
03. නීති අංශය
04. භෞතික සැලසුම් අංශය
05. පොදු කළමනාකරණ අංශය
06. පර්යේෂණ අංශය
07. ධාරිතා සංවර්ධන අංශය
08. පුහුණු අංශය

## අරමුණු

- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන්හි සහභාගීත්වය ඇතිව පළාත් පාලනය හා සම්බන්ධ ආයතනයන්හි ආයතනික ශක්තිය වැඩිදියුණු කරලීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කරලීම පිණිස පළාත් කළමනාකරණ සහ පුහුණු ඒකක ශක්තිමත් කිරීම.
- පළාත් පාලනයේ සියලු පාර්ශවකරුවන්ට තාක්ෂණ හා තොරතුරු සේවා සපයමින් ජාතික සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- අදාල ජාතික හා අන්තර් ජාතික ආයතන සමග සබඳතා පවත්වා ගනිමින් පළාත් පාලනයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ ආයතනික කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධව විශේෂඥ සේවා සැපයීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි නෛතික කරුණු සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනවලට අදාල දත්ත හා තොරතුරු එක්රැස් කිරීම සහ එම තොරතුරු පවත්වාගෙන යාම.

## මෙහෙවර

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙවර වනුයේ කළමනාකරණය, උපදේශනය, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ හා තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමයි. ඒ සඳහා පහත සඳහන් කාර්යයන් මෙම ආයතනය විසින් ඉටුකරනු ලබයි.

- පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයන් උපයෝගි කර ගනිමින් පළාත් සභාවන්හි සහ පළාත් පාලන ආයතනයන්හි හැකියා වර්ධනය කිරීම සඳහා සැලසුම් සකස්කොට ක්‍රියාත්මක කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනය ශක්තිමත් කිරීම සඳහා උපදේශනය, පුහුණු සහ පර්යේෂණ සේවා ලබාදීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළාත් පාලනයට සම්බන්ධිත ආයතන සමග අන්තර් සබඳතා ගොඩනගා ගනිමින් පළාත් පාලනය පෝෂණය කිරීම.
- පළාත් පාලන ව්‍යුහය සඳහා තාක්ෂණික තොරතුරු සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන කාර්යක්ෂම කරවීමට අදාල වන ආධාර සහ පුහුණු හා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

12.2. 2014 වර්ෂයේ සැලසුම් කල වැඩසටහන්

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය **විසින් පුහුණු වැඩමුළු, සම්මන්ත්‍රණ හා ප්‍රායෝගික සැසි යනාදී වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම පළාත් පාලන පුවත් ඇතුලත් පළාත් පාලන පුවත්පත සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කෙරේ.**


**(අ) 2014 වර්ෂය සඳහා සැලසුම් කල වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| අංශය | කාර්යයන්/ පාඨමාලාවන් | වර්ෂය තුල පැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව | අපේක්ෂිත වියදම (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | අපේක්ෂිත පුහුණු-ලාභීන් සංඛ්‍යාව/ වැඩමුළු | සත්‍ය පුහුණු-ලාභීන් සංඛ්‍යාව/ වැඩමුළු | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු අංශය | දැනුවත් කිරීමේ වැඩමුළු | 57 | 2.957 | 2.497 | 84 | 2,190 | 2,519 | 115 |
| මූල්‍ය කළමනාකරණ | පුහුණු වැඩමුළු සහ පාඨමාලා | 84 | 3.565 | 3.243 | 91 | 3,542 | 3,551 | 100 |
| නීති අංශය | දැනුවත්කිරීමේ වැඩමුළු | 76 | 3.080 | 3.154 | 102 | 4,251 | 4,600 | 108 |
| භෞතික සැළසුම් අංශය | දැනුවත්කිරීමේ වැඩමුළු | 47 | 3.575 | 2.680 | 75 | 1,830 | 1,681 | 92 |
| පොදු කළමනාකරණ අංශය | දැනුවත්කිරීමේ වැඩමුළු | 49 | 2.250 | 2.392 | 106 | 1,640 | 1,400 | 85 |
| පර්යේෂණ අංශය | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පර්යේෂණ කාර්යයන් | 62 | 2.590 | 2.401 | 93 | 2,440 | 2,300 | 94 |
| ධාරිතා සංවර්ධන අංශය | පුහුණු වැඩසටහන් | 66 | 3.580 | 3.103 | 87 | 1,090 | 816 | 75 |
| පුහුණු අංශය | ප්‍රාදේශීය වැඩමුළු හා පළාත් පුහුණු වැඩසටහන් | 167 | 7.109 | 5.848 | 82 | 8,316 | 7,443 | 90 |

අපේක්ෂිත හා සත්‍ය වියදම අංශ අනුව බෙදී ගොස් ඇති ආකාරය වගු අංක 02න් හා ප්‍රස්ථාර අංක 02 න් දැක්වේ. ප්‍රස්ථාර අංක 03න් මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය දැක්වේ.


| **අංශය** | **අපේක්ෂිත වියදම (රු.මි.)** | **සත්‍ය වියදම (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය %** | **භෞතික ප්‍රගතිය %** |
|---|---|---|---|---|
| ඉංජිනේරු අංශය | 3.0 | 2.5 | 84 | 115 |
| මූල්‍ය කළමනාකරණ අංශය | 3.6 | 3.2 | 91 | 100 |
| නීති අංශය | 3.1 | 3.2 | 102 | 108 |
| භෞතික සැළසුම් අංශය | 3.6 | 2.7 | 75 | 92 |
| පොදු කළමනාකරණ අංශය | 2.3 | 2.4 | 106 | 85 |
| පර්යේෂණ අංශය | 2.6 | 2.4 | 93 | 94 |
| ධාරිතා සංවර්ධන අංශය | 3.6 | 3.1 | 87 | 75 |
| පුහුණු අංශය | 7.1 | 5.8 | 82 | 90 |
| **මුළු වියදම** | **28.9** | **25.3** | **88** | |

වගු අංක 02




ප්‍රස්ථාර අංක 02

**2014 වර්ෂය සඳහා සැලසුම් කල වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**




ප්‍රස්ථාර අංක 03

අමාත්‍යාංශ වැය ශීර්ෂ වලින් මෙම ආයතනය වෙත පහත සඳහන් පරිදි අරමුදල් නිදහස් කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| **විස්තරය** | **නිදහස් කල ප්‍රතිපාදන (රු.මි.)** | **වාර්තාවේ ඇති වියදම (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය %** |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා | 29.5 | 28.6 | 97 |
| ප්‍රාග්ධන වියදම් සඳහා | 70.0 | 59.5 | 85 |

# 13 දේශීය ණය සහ සංවර්ධන අරමුදල

### දැක්ම

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම.

### මෙහෙවර

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් තිරසාර සහ ස්වාධීන මූල්‍ය ආයතනයක් තුළින් ලබා දී රටේ සමාජ සහ ආර්ථික වර්ධනයට දායකවීම.

### කාර්යභාරය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනතින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට අයත්වන අතර පනත ක්‍රියාත්මක කිරීමේ බලතල පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය සතුය. දිවයිනේ පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සහන ණය ක්‍රමයක් යටතේ සපයනු ලබන එකම රාජ්‍ය ආයතනයයි.

### අරමුණු

පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගිතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොලියකට මූල්‍ය පහසුකම් සැපයීම හා එම ණය මුදල් සහ විදේශ ව්‍යාපෘති හරහා පළාත් පාලන ආයතන වෙත ලබාදී ඇති ණය මුදල් ක්‍රමානුකූලව නැවත අයකර මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීමත් මූලික කාර්යභාරය වේ.

### 13.1 පළාත් පාලන ආයතන වෙත ණය මුදල් නිකුත් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති පහත දැක්වේ.

01. ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම සහ සතිපොළ නවීකරණය කිරීම
02. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
03. ආදාහනාගාර ඉදිකිරිම
04. මාර්ග ඉදිකිරීමේ යන්ත්‍ර සූත්‍ර සහ කසළ අපහරණය සඳහා ට්‍රැක්ටර් මිලදීගැනීම
05. පොදු වෙළඳපළ ඉදිකිරීම

06. කාර්යාල ගොඩනැගිලි සහ පුස්තකාල ඉදිකිරීම

07. මාර්ග සංවර්ධන ව්‍යාපෘති

08. පානීය ජල සැපයුම් ව්‍යාපෘති

09. වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති

## අරමුදල්

ණය මුදල් සැපයීම සඳහා අවශ්‍ය අරමුදල්, සහන පොළී පදනමක් මත වසර 25 කින් ආපසු ගෙවිය යුතු පදනම මත ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලැබේ.

මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත පළාත් පාලන ආයතන සඳහා නිකුත් කළ ණය මුදල් ආපසු අයකර මහා භාණ්ඩාගාරය වෙත ගෙවීමේ වගකීමද දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇති අතර, එම අරමුදල් පළාත් පාලන ආයතන වෙත ණය වශයෙන් නිකුත් කිරීම සඳහා වක්‍රීය කිරීමේ පහසුකම්ද සලසා ඇත.

## 13.2 2014 වර්ෂයේ දී ඉටු කරන ලද කාර්යයන්

2014 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මිලියන 600 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණි. මෙම වර්ෂය තුලදී පළාත් පාලන ආයතන වෙත නිකුත් කර ඇති මුළු මුදල රු.මි. 303.4 කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5-10 කින් ආපසු ගෙවිය යුතු වේ. මීට අමතරව අනුමත කර ඇති නමුත් ඉදි කිරීම් වල ප්‍රගතිය මත නිකුත් කළ යුතුව ඇති ණය මුදල් වල අගය රු.මි. 600 ක් පමණ වේ.

**(අ) වර්ෂය තුලදී ව්‍යාපෘති අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය දැක්වෙන සාරාංශය පහත පරිදි වේ.**

| | | මූල්‍ය ප්‍රගතිය | | | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත වියදම රු.මිලියන | සත්‍ය වියදම රු.මිලියන | මූල්‍ය ප්‍රගතිය % | අපේක්ෂිත භෞතික ප්‍රගතිය (ව්‍යාපෘති සංඛ්‍යාව) | සත්‍ය භෞතික ප්‍රගතිය (ව්‍යාපෘති සංඛ්‍යාව) | භෞතික ප්‍රගතිය % |
| 01 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 115 | 102.23 | 89 | 15 | 11 | 75 |
| 02 | ආදාහනාගාර ඉදි කිරීම | 80 | 63.40 | 79 | 10 | 11 | 110 |
| 03 | සතිපොළ හා ආර්ථික මධ්‍යස්ථාන ඉදි කිරීම | 40 | 48.90 | 122 | 05 | 04 | 80 |
| 04 | පොදු වෙළෙඳපොළ ගොඩනැගිලි ඉදි කිරීම | 200 | 62.87 | 31 | 05 | 05 | 100 |
| 05 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති | 30 | 26.00 | 81 | 02 | 01 | 50 |

## (ආ) ණය වාරික හා පොළී අයකර ගැනීමේ ප්‍රගතිය 2014

| පළාත | ණය වාරික හා පොළී ඇස්තමේන්තු ගත වටිනාකම (රු.මි.) | වාරික හා පොළී ලැබීම් (රු.මි.) | ප්‍රතිශතය % |
|---|---|---|---|
| මධ්‍යම | 176.25 | 151.21 | 86 |
| නැගෙනහිර | 20.20 | 14.18 | 70 |
| උතුරු මැද | 45.73 | 33.36 | 72 |
| උතුර | 40.16 | 36.73 | 91 |
| වයඹ | 126.65 | 103.87 | 82 |
| සබරගමුව | 69.74 | 40.34 | 57 |
| දකුණ | 71.47 | 41.50 | 58 |
| ඌව | 87.73 | 52.17 | 59 |
| බස්නාහිර | 155.70 | 132.86 | 85 |
| **එකතුව** | **793.63** | **606.22** | **76** |


## (ඇ) ණය අනුමත කිරීමේ ප්‍රගතිය - 2014

| පළාත | ඇස්තමේන්තු ගත වටිනාකම (රු.මි.) | 2014 වර්ෂයේ අනුමත කල මුදල (රු.මි.) | ප්‍රතිශතය % |
|---|---|---|---|
| මධ්‍යම | 100 | 56.50 | 57 |
| නැගෙනහිර | 100 | 27.10 | 27 |
| උතුරු මැද | 100 | 131.24 | 131 |
| උතුර | 50 | 23.00 | 46 |
| දකුණ | 50 | 99.78 | 199 |
| වයඹ | 50 | 320.90 | 644 |
| සබරගමුව | 50 | 10.00 | 25 |
| ඌව | 50 | 16.20 | 32 |
| බස්නාහිර | 50 | 262.60 | 325 |
| **එකතුව** | **600** | **947.32** | **158** |

නිකුත් කරන ලද ණය වර්ග අනුව මහා භාන්ඩාගාරය වෙත වාරික හා පොළී ගෙවීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වගු අංක 03 න් හා ප්‍රස්ථාර අංක 04 න් පෙන්නුම් කරන ලද අතර පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ (LGIIP) නිකුත් කල ණය මුදල් සඳහා සහන කාලය තුළදී පොළිය පමණක් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීම් කරනු ලැබේ.

| වර්ෂය | ණය වාරික හා පොළිය (රුපියල් මිලියන වලින්) | | | |
|---|---|---|---|---|
| | දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) | බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) | නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) |
| 2008 | 48.50 | 6.00 | 96.10 | - |
| 2009 | 47.20 | 7.94 | 129.50 | - |
| 2010 | 48.00 | 6.17 | 123.40 | - |
| 2011 | 46.40 | 7.15 | 123.40 | 34.70 |
| 2012 | 44.70 | 8.86 | 200.40 | 29.00 |
| 2013 | 43.17 | 6.89 | 189.55 | 35.65 |
| 2014 | 41.20 | 8.99 | 190.90 | 35.00 |
| **එකතුව** | **319.17** | **52.00** | **1053.25** | **134.35** |

වගු අංක 03





ප්‍රස්ථාර අංක 04

(ඉ) 2014 වර්ෂයේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය වගු අංක 04 න් හා ප්‍රස්ථාර අංක 05 න් දැක්වේ.

| ණය වර්ගය | වාරික අය කිරීම් (රු.මි.) | පොළී අය කිරීම් (රු.මි) | ණය වාරික හා පොළී ලැබීම් (රු.මි) |
|---|---|---|---|
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නිකුත් කල ණය (LLDF) | 157.25 | 56.23 | 213.48 |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කල ණය මුදල් (PCDP) | 1.50 | 7.29 | 8.79 |
| නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 89.63 | 80.04 | 169.67 |
| පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) | 116.23 | 143.28 | 259.51 |
| එකතුව | **364.61** | **286.84** | **651.45** |

වගු අංක 04




ප්‍රස්ථාර අංක 05



330, යූනියන් පෙදෙස, කොළඹ 02.
330, யூனியன் பிளேஸ், கொழும்பு 02.
330, Union Place, Colombo 02.